# අප ගැන බිඳක්

දකුණු ආසියාවේ විශිෂ්ඨතම කළමනාකරණ පීඨය වන අභිමානවත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය වසර 50ක් ඉක්ම වූ ඉතිහාසයකට හිමිකම් කියනු ඇත. රාජ්‍ය පරිපාලන විද්‍යා උපාධි පාඨමාලාව ද එවැනිම වූ ඉතිහාසයකට උරුමකම් කියනු ඇත. ව්‍යාපාර පරිපාලනය පිළිබඳවත්, රාජ්‍ය පරිපාලනය පිළිබඳවත් පාඨමාලා දෙකක් 1959 / 60 ශාස්ත්‍ර පීඨයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය විසින් හඳුන්වා දෙනු ලැබීය. ඒ අපගේ අභිමානවත් ගමන් මගේ මූලාරම්භයයි. වර්ෂ 1968 දී කළමනාකරණ පීඨය බිහි වෙමින් එම පාඨමාලා දෙක නව පීඨයක් බවට පත් විය. මෙම පාඨමාලා සඳහා 1980 දී වෙනම අධ්‍යයනාංශ හිමිවිය. ඒ අනුව 1980 දී රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය ස්ථාපිත කෙරිණි. අද ඔබ වෙතට මෙම අධ්‍යාපනික සඟරාව ගෙන එන රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය සිය ඇරඹුම සටහන් තබන්නේ එලෙසිනි.

විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන විද්‍යා විශේෂ උපාධි පාඨමාලාව පවත්වාගෙන යාමේ පූර්ණ වගකීම එවක පටන් මෙම අධ්‍යයනාංශයේ මෙහෙයවීම යටතේ සිදු වූ අතර එය සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් විය. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂ උපාධි පාඨමාලාව නමින් 1993 දීත්, රාජ්‍ය කළමනාකරණ (විශේෂ) උපාධි පාඨමාලාව නමින් 2001 දීත්, කාලීන අවශ්‍යතා පරිදි නවීකරණය වෙමින් එය ක්‍රියාත්මක වන්නේ දිවයිනේ නන් දෙසින් මෙම පාඨමාලවට තේරී පත්වන ශිෂ්‍ය ප්‍රජාවකගේ සංකලනයක් ලෙසිනි.

ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල අතුරින් රාජ්‍ය පරිපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රථම උපාධියක් සහ පාඨමාලාවක් මෙහෙයවන ප්‍රථම හා එකම අධ්‍යයනාංශය ලෙස රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය මහත් වූ අභිමනින් සිය වගකීම වන හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ උපාධිදරයන් දැයට දායාද කිරීමෙහි ලා නිරත වනු ඇත.

විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ විශේෂ උපාධි පාඨමාලාව, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාව සහ රාජ්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව, රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය අභිමානයෙන් පිරිනමන්නා වූ පාඨමාලාවෝ වෙති.

රාජ්‍ය කළමනාකරණ විශේෂ උපාධි පාඨමාලාව හුදු විෂය සීමාවකින් ඔබ්බට ගොස් විශ්වවිද්‍යාලයීය උපාධිදරයෙකු හට ලැබිය යුතු පරිපූර්ණ වූ විෂයන් ගණනාවකින් පෝෂණය වන්නා වූ උපාධි පාඨමාලාවකි. එකී පාඨමාලාව මඟින් රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශයේ ම කළමනාකරණය පිළිබඳ ඉතා විශිෂ්ඨ වූ දැනුමකින් යුත් විද්‍යාර්ථයින් බිහි කරනු ඇත.

රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය, ගණකාධිකරණය, මූල්‍ය, ගණිතය, මානව සම්පත් කළමනාකරණය, සංවර්ධන චර්යාව, ආර්ථික විද්‍යාව, පරිගණක හා තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන්ගේ සුසංයෝගයෙන් රාජ්‍ය කළමනාකරණ උපාධි පාඨමාලාව පරිපූර්ණව ඇත.

විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ විශේෂ උපාධි පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරමින් විශිෂ්ට කුසලතා විදහාපාන විද්‍යාර්ථයින් ඇගයීමට ලක් කරනු පිණිස වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේ දී ස්වර්ණ මුද්‍රිතා ප්‍රදානය කරනු ලබන අතර එමඟින් සිසුන් දිරිගැන්වීම අපේක්ෂා කෙරේ. එකී ස්වර්ණ මුද්‍රිතා අතරට,

- රාජ්‍ය පරිපාලන විද්‍යා ආදි ශිෂ්‍ය සංගමයේ ස්වර්ණ මුද්‍රිතාව.
- රමණී සමරතුංග ස්වර්ණ මුද්‍රිතාව.
- දේශමාන්‍ය මහාචාර්ය ලීනස් සිල්වා අනුස්මරණ ස්වර්ණ මුද්‍රිතාව ඇතුලත්ය.

රාජ්‍ය පරිපාලන විද්‍යා ආදි ශිෂ්‍ය සංගමය අප අධ්‍යයනාංශයේ අධ්‍යාපනය හදාරා විසිරී ගොස් සිටින විද්‍යාර්ථයින්ගෙන් සැදුම් ලද්දකි. එකී ආදි ශිෂ්‍ය සංගමය අප විසින් ශිෂ්‍ය සංගමයක් ලෙස ඉටුකරන්නා වූ විවිධ ප්‍රයත්නයන් හිදී අපහට අග්‍රගන්‍ය ශක්තියක්වූ බව කිව මනාය. රාජ්‍ය පරිපාලන විද්‍යා ආදි ශිෂ්‍ය සංගමයේ මැදිහත් වීමෙන් සම්පාදනය වී ඇති අරමුදලින් අප අධ්‍යයනාංශයේ මූල්‍ය දුෂ්කරතා වලින් පීඩා විඳින ශිෂ්‍ය ශිෂ්‍යාවන් උදෙසා අධ්‍යයනාංශය හරහා මූල්‍යමය ශිෂ්‍යත්ව ප්‍රදානය කරමින් එකී ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගේ අධ්‍යාපනික කටයුතු උදෙසා ලබා දෙන්නා වූ දායකත්වය සැබවින්ම ප්‍රශංශනීය ය.

රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයේ, ප්‍රථම, දෙවන, තෙවන හා සිව්වන අධ්‍යයන වසරවල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සාමුහිකත්වයෙන් පවත්වගෙන යන්නා වූ රාජ්‍ය පරිපාලන විද්‍යා විෂය සංගමය විසින් සැමවිටම අප අධ්‍යයනාංශයේ විද්‍යාර්ථයින්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කරමින් ඔවුන්ගේ අනාගත ගමන් මග අර්ථ ගැන්වීමෙහිලා පුරොගාමී මෙහෙවරක් ඉටු කරනු ලබයි. අන්‍යෝන්‍ය අවබෝධය, සහයෝගීතාවය සහ එකමුතුකම තුලින් සාමුහික අරමුණු ඉටුකර ගැනීමට විෂය සංගමය මඟින් ක්‍රියාත්මක කරන විවිධ වැඩ සටහන් තුළින් ලබෙනුයේ අගනා පිටිවහලකි.

එලෙසින් රාජ්‍ය පරිපාලන විද්‍යා විෂය සංගමයේ සිව් වසරක ශිෂ්‍ය සහභාගිත්වයේ සවිමත් සබඳියාවේ හා අප්‍රතිහත ධෛර්යයේ අනගිභවනීය ඵලයක් ලෙස ලෙස මෙම Classic අධ්‍යාපනික සඟරාව මෙවරද අප විසින් එළි දැක්වනු ලබන්නේ මහත් අභිමානයෙනි. මෙවර මෙම සඟරාව සමස්ත අප විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන්ගේ ද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේද හැකියා කුසලතා වල එකතුවක් ලෙස එළි දැක්වීමට හැකි වීම පිලිබඳව අප තුල ඇත්තේ නිහතමානී වූ අභිමානයකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කලමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් පමණක් දැයට තිලිණ කරන රාජ්‍ය කළමනාකරණ විශේෂ උපාධි පාඨමාලාව හුදෙක් තවත් එක් උපාධි පාඨමාලාවක් නොව එය ඉතාමත් සුවිශේෂී වූ ද අග්‍රගණ්‍ය වූ ද උපාධි පාඨමාලාවකි.

අප අධ්‍යයන අංශය මගින් දැයට දායාද කළ විද්‍යාර්ථයින් අද වන විට ඉහළම ස්ථාන වල රැඳී සිටිමින් සමාජයට අතිමහත් සේවයක්, කාර්යයභාරයක් ඉටුකරනුයේ අප අධ්‍යයනාංශයේ අභිමානය තව තවත් විදහා දක්වමිනි.

එලෙසින්ම අනාගතයේදී අප අධ්‍යනාංශයයේ අභිමානය තව තවත් ඉහළ නැංවීමෙහිලා දායක විය හැකි රටට දැයට වැඩදායී විද්‍යාර්ථයින් තම අරමුණු සඵල කර ගැනීමට අවශ්‍ය මංපෙත් විවර කරගනු අතැයි යන්න අපගේ ඒකායන අපේක්ෂාව වේ.



## Message from the Vice Chancellor

I write this congratulatory message to be included in the Classic Magazine – 2017

The Department of Public Administration of the Faculty of Management Studies and Commerce of this University publishes "CLASSIC Magazine" annually as the only educational publication of the Faculty which is edited and published by the student.

Comprising of articles written on various topics by the members of the Academic Staff and undergraduates of Universities island-wide, the Classic Magazine helps to expand the horizons of knowledge of the readers, which is an objective of the University.

I take this opportunity to convey my appreciation to the editorial board and to those who have contributed articles.

Finally, I wish the magazine every success and wish those who have contributed to see the successful publication of the magazine every success in their future endeavors.

**Prof. Sampath Amarathunga**
**Vice Chancellor**



## Message from the Dean

As the Dean of FMSC, it is a pleasure for me to send this congratulatory message at the launch of the 6th volume of 'Classic' educational magazine compiled and published by Department of Public Administration, Faculty of Management Studies and Commerce, University of Sri Jayewardenepura.

As FMSC, we are committed to high quality teaching and research stimulated by an intellectually-awaken multi-disciplinary academic environment for our undergraduates and also are dedicated to impart them with specialized knowledge, required skills, positive and constructive attitudes and finer humane qualities without being limited to theoretical knowledge in our attempt to train them as versatile graduates who will successfully face their personal and social challengers while realizing national aspirations. In making this a reality, we expect that each department will pay their attention on this and be in search of opportunities for extending their cooperation to the faculty by organizing various types of extra-curricular activities, events and functions.Among them, the Association of Public Administration as a leading student body of the Department of Public Administration is exemplary as it has been able to successively publish and circulate the 'Classic' magazine, a collection of interviews, articles and creative writing of undergraduates and academics our state universities and outstanding national level professionals etc. in line with the objectives of the department and the mission of the Faculty as well by developing text skills of department undergraduates and promoting knowledge sharing and dissemination and integration among undergraduates, academia and society.

Therefore, I would like to mention here that the Department of Public Administration as one of the leading departments in our faculty has shown its commitment by fulfilling its responsibilities to the faculty despite the busy academic agenda.

As such, I take this opportunity to sincerely appreciate the academic staff for supervision and the student body for their genuine efforts.

In conclusion, I wish that you as undergraduates of the department will get maximum benefits from these rare opportunities and become geniuses bringing honor and credit to the Department, Faculty, University and also to the Country.

**Best wishes!**
**Thank you.**
**Dean**
**Dr U. Anura Kumara**
**Faculty of Management Studies and Commerce**





## Message from the Head of the Department

I am sending this message with great pleasure to the 6th volume of "CLASSIC" Magazine published by Students' Association of Public Administration (APA), Department of Public Administration, Faculty of Management Studies and Commerce, University of Sri Jayewardenepura, Sri Lanka. The Classic is one of main academic activities of the APA and I am happy to note the APA of the Department has been able to publish the magazine for several years; 2006, 2012, 2014, 2015, 2016 and this makes the 6th successive year of publication.

The main purpose of this magazine is to provide opportunities for students to develop their writing, thinking and analytical abilities. Hence, the students in the Department get the opportunity to publish their research findings, subject-related articles and creative work. We know that publishing a magazine involves much hard work with several activities and by doing such, the organizers of the "CLASSIC" have a unique opportunity to improve their practical skills as they are engaged actively in the entire process of completion of magazine. Further, academics also have an opportunity to provide articles to the magazine with the intent of disseminating knowledge toward an educated society.

I congratulate to APA, as they were able to publish the Magazine continuously for last several years. I wish to draw your attention to a statement quoted by first editorial committee of the Classic as "there would be no gain when there is no pain and every successful event have has numerous dedications behind the screen no one can see" which reminds us that there is no easy path to success. As such, I extend my gratitude to the students, lectures and all others for their commitment toward the success of this publication and also particularly, the working committee of the Association of Public Administration (APA) for great efforts to make the 6th edition of the magazine a reality.

**May "CLASSIC" achieve greater success!**
**Prof. (Mrs.) R. Lalitha S. Fernando**
**Head, Department of Public Administration**

Association of Public Administration

**"CLASSIC"** educational magazine is one of the golden concepts introduced by the Association of Public Administration of the University of Sri Jayewardenepura with the aims of creating a readable society and enhancing knowledge and attitude of university student and school children in Sri Lanka. The Association of Public Administration is committed in achieving its one of the visions to bring the "CLASSIC" magazine to be the best educational magazine in Sri Lanka.

We are proud to launch the 6th volume of the "CLASSIC" magazine in the year 2017 with a brand new outlook to allow readers gain vast knowledge in the field of Public Administration and several other related areas. Out editorial board has carefully reviewed the articles in order to provide and assurance to our readers about the quality, accuracy and timeliness of the knowledge that they will gather through the articles published in the magazine.

We must extend our greatest attitude to all parties who supported us to make this event success. Special thanks to the Vice Chancellor of the University of Sri Jayewardenenepura, Dean of Faculty of Management Studies and Commerce, Head of the Department of Public Administration, all the lectures and students who provided articles, to all the sponsors who provided us the financial strength and to everyone who helped us in many ways.

Finally, we would like to wish all our readers to achieve the best in their lives with the continuous enrichments of their knowledge inventories.

**Editorial Board**
**Classic 2017**

# Content

## LEGION OF PUBLIC ADMINISTRATION



## Educational Articles




## Free Verses







# Content

## Social & Political



## NEWS



## Short Stories



## APA Board of Officials 2017/18

**Co - Presidents**

A.K. Jayathilaka

R.M.D.L. Senevirathne

R.G.D.Mahanama

**Vice President**

D.S.R.M.Jayathilaka

**Secretary**

G.H.L.Fonseka

**Vice Secretary**

M.G.H.Madusha

**Senior Treasurer**

W.G.T.S. Senanayake (Lecturer)

**Junior Treasurer**

S.P.N.R.M.Wijerathna

**Auditor**

M.A.D.Dushanthi

**Committee Members**

J.M.Priyamwada

Dinushika Madhushani

L.H.M.D.Pranandu

P.T.Abeysinghe

H.W.D.S.Gunathilaka

K.H.U.Wickramanayaka

## Editorial Committee

H.G.L.S.Samarasinghe(Editor)

Chanduma Sathaerasinghe (Sub Editor)

Nilmini Rathnayake

Prasadi Karunasekara

G.H.L.Fonseka

K.R.A.W.Ranatunga

M.A.D.N.Chathurangani

H.D.A.Zoysa

S.A.D.T.P. Rasanika

G.H.C.Chathuranga

## Cover Story




*"Discipline is not consistency, and the reason why I say that is - like, for an example, making prayer five times a day, that establishes routine and consistency. That I can do. And having certain fundamental consistencies in business, can do. But time management, outside of that, that's where that's a challenge."*

***Ali Shaheed Muhammad***

**Lecturer by Charge**

Professor R. Lalitha S Fernando

W.M.D.M. Dissanayaka ( Tutor )

H.M. Thathsarani ( Tutor )

මුද්‍රණය - ඇඩ් ඇඩ්ස්, මහරගම
0722 936 790







# ග්‍රාමීය සංවර්ධනය ශ්‍රී ලංකාව වැනි රටකට වැදගත් වේ ද?

ග්‍රාමීය හෝ ගැමි එසේත් නැතිනම් ගම්බද යන වචනය දකින සැණින් කාගේත් චිත්ත රූපය තුළ මැවී යන්නේ ඉතා අඩු ආදායම් තත්ත්වයක් පවතින අවට පහසුකම් භුක්ති විඳින ඉතාමත් දුෂ්කර ජීවන පැවැත්මක් සහිත මිනිසුන් පිරිසක් ජීවත්වන ප්‍රදේශයන් ය. සාමාන්‍ය පුද්ගලයෙකු ග්‍රාමීය ප්‍රදේශයක් නිර්වචනය කරන්නේ ආර්ථික වශයෙන් පසුගාමී වූ ප්‍රදේශයන් ය. මීට අමතර ව ග්‍රාමීය ප්‍රදේශයන්හි දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ කීපයකි.

- ඉතා අඩු ජන සංඛ්‍යාවක් ජීවත් වීම
- ස්වභාවධර්මය මත රඳා පැවතීම
- ඉහළ දරිද්‍රතාවකින් යුක්ත වීම
- ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීම
- මූලික යටිතල පහසුකම් වල හිඟතාව
- අඩු ආදායම් මට්ටම හා නුපුහුණු ශ්‍රමයක් පැවතීම

ඉහත සාධක වලින් යුක්ත ප්‍රදේශයක් ග්‍රාමීය ප්‍රදේශයක් ලෙස දැක්විය හැකි අතර එම ප්‍රදේශයන් සංවර්ධනය ග්‍රාමීය සංවර්ධනය ලෙස සරලව අර්ථ දැක්විය හැකි ය. වෙනත් ලෙසකට කියනවා නම් ග්‍රාමීය ප්‍රදේශයන් හි ජීවත් වන පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම ලෙස ග්‍රාමීය සංවර්ධනය හැඳින්විය හැකිය. ග්‍රාමීය සංවර්ධනයේ ප්‍රධාන අරමුණ ලෙස, යටිතල පහසුකම්, රාජ්‍ය සේවය හා සන්නිවේදනය නගා සිටුවීමත්, අධ්‍යාපනය, සෞඛ්‍ය හා ජීවන තත්ත්වය වර්ධනය කිරීමත් රැකියාවන් හා ආර්ථික ක්‍රියාකාරකම් උත්පාදනය ලෙස මූලිකව දැකිය හැකිය.

ග්‍රාමීය සංවර්ධනය ශ්‍රී ලංකාව වැනි රටකට වැදගත් වේ ද? ශ්‍රී ලංකාව අප දන්න දා පටන් දියුණු වෙමින් පවතින එහෙමත් නැත්නම් තුන්වන ලෝකයේ රටකි. ඉතින් දියුණු වෙමින් පවතින රටක ග්‍රාමීය සංවර්ධනය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබනවා. එය සනාථ කිරීම සඳහා අපට පහත කරුණු ඉදිරිපත් කළ හැකිය.

ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කළ හැකි කරුණු වශයෙන් ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 81% ක ප්‍රමාණයක් ජීවත් වනු ලබන්නේ ග්‍රාමීය ප්‍රදේශයක් තුළ ය. ඉතින් රට සංවර්ධනය කර යන ගමනේ දී 19% ජනගහනයක ජීවන තත්ත්වය පමණක් ඉහළ නැංවීම ප්‍රමාණවත් නොවේ. රටක් සංවර්ධනය වීමට නම් එම රටේ ජීවත් වන සෑම පුද්ගලයෙකුගේ ම ජීවන තත්ත්වය ඉහළ නැංවීය යුතු වේ. එබැවින් ග්‍රාමීය සංවර්ධනය වැදගත් අංශයක් බව පසක් වේ. එමෙන්ම රටේ ආහාර සැපයීම සඳහා ප්‍රධාන වශයෙන් මුල්තැන ගනු ලබන්නේ රටක ග්‍රාමීය ප්‍රදේශයන් ය. මන්ද යත් ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය ලෙස සිදුකරන්නේ කෘෂිකර්මාන්තය නිසාවෙනි. එදිනෙදා ජීවතයේ දී භාවිතයට ගනු ලබන දේශීය එළවළු පලතුරු ධාන්‍ය වර්ග ලබා ගන්නේ ග්‍රාමීය ජනතාව නිසාවෙනි ඔවුන් කෘෂිකර්මාන්තයෙහි නොරැඳුණහොත් රටේ ජනතාවගේ දෛනික ආහාර වේලට කුමක් වේ ද යන්න ගැටලු සහගත වේ. එමෙන්ම දළ දේශීය නිෂ්පාදන සඳහා වැඩි දායකත්වයක් සපයනු ලබන්නේ ග්‍රාමීය ජනතාවගේ නිෂ්පාදනයන් ය. තවත් වැදගත් කරුණක් ලෙස සඳහන් කළ හැකි සාධකයක් ලෙස ශ්‍රී ලංකාව විශාල වශයෙන් ආදායම් ලබන සංචාරක කර්මාන්තය දැක්විය හැකිය. ග්‍රාමීය පළාත්වල පවතින සුන්දරත්වය විඳ ගැනීමට විදේශ රටවල් වල සංචාරකයින් පැමිණීමට හේතු වන විශාල ආදායමක් උපයා ගනී. මේ ආකාරයේ හේතු නිසාවෙන් ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටක ග්‍රාමීය සංවර්ධනය වැදගත් බව සඳහන් කළ හැකි ය. නමුත් ශ්‍රී ලංකාව තුළ පවතින දේශපාලන ආර්ථික හා සමාජීය පසුබිම තුළ ග්‍රාමීය සංවර්ධනය පසුගාමී තත්ත්වයට පත් වී ඇත. මෙය ගැමියන් විසින් සරලව අර්ථ දක්වනු ලබන්නේ ''කොළඹට කිරි ගමට කැකිරි'' ලෙස ය. නමුත් මේ පවතින තත්ත්වයෙන් මිදී රට සංවර්ධනය කරා යන ගමනේ දී නගරයත් ගමත් එක ලෙස සංවර්ධනය කර සංවර්ධිත රටක් ගොඩ නැගීමට සෑම දෙනා එකලෙස දායක විය යුතු බව මගේ අදහසයි.

කේ.ආර්.ඒ.ඩබ්ලිව්. රණතුංග
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
තෙවන වසර

# LEGION OF PUBLIC ADMINISTRATION

## හිටපු ජ්‍යෂ්ඨ පොලිස්පති, ආචාර්ය ජයන්ත වික්‍රමරත්න



"ශ්‍රී ජයවර්ධනපුර විදු මාතාවගේ උණුසුම ලබමින් බිහි වූ තවත් එක උදාර දායාදයක් වූ ඔහු ජයන්ත වික්‍රමරත්න නම් වේ. ශ්‍රී ලංකා මාතාවගේ ඉතා උසස් තනතුරු කිහිපයක් ම මොහු විසින් හොබවන ලදී. ශ්‍රී ලංකා පොලිස්පති ධූරය, ආරක්ෂක අමාත්‍යංශයේ අතිරේක ලේකම් ධූරය මෙන් ම අල්ලස් හා දූෂණ කොමිසමේ කොමසාරිස් ධූරය ඒ අතර වේ."

"ඔහුගේ වටිනා කාලය මිඩංගු කරමින් අප සමග සොඳුරු කථා බහක නියැලීම පිළිබඳ ව අපගේ හද පිරි කෘතවේදීත්වය මේ මොහොතේ එතුමන්ට පිරිනමන්නෙමු !"

ප්‍රඃ ඔබතුමාගේ විශ්වවිද්‍යාල කාලය හා ඊට පෙර කාලය පිළිබඳ ව අපට යමක් ප්‍රකාශ කළොත් ?

තර්ස්ටන් විද්‍යාලයේ A/L කරන කලේ මගේ ලොකු අරමුණක් තිබුණා උපාධියක් ලබා ගන්න. උපාධිය ලබාගෙන සහකාර පොලිස් අධිකාරී තනතුරකට පත් වෙන්න. එකට ඇත්තට බලපෑවේ ඒ දවස්වල "වැලිකතර" කියන චිත්‍රපටිය. එකේ නළුවට හිටපු ගාමිණී ෆොන්සේකා රඟපෑවේ ඒ.එස්.පී. කෙනෙක් විදිහට. අපි තරුණයෝ නිසා ඒක ලොකුවට බලපෑවා.

A/L කරන කොට මම හොයලා බැලුවා මොන විශ්වවිද්‍යාලයට ගියොත් ද ඒ.එස්.පී. තනතුරට අදාළ වෙන්නේ කියලා. එතකොට මට දැනගන්න ලැබුණා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ Public Adminstration ප්‍රයෝජනවත් වෙයි ඒ.එස්.පී. ඉන්ටර්විව් එකේ දී කියලා. දෙමව්පියන්ගේ ආශීර්වාදයෙන් දෙවියන්ගේ පිහිටෙන් මම එක අභියෝගයක් ජයගත්තා. විශ්වවිද්‍යාලයේ දී හොකී සහ බාස්කට් බෝල් සෙල්ලම් කරලා කලර්ස් ගත්තා. පැවති ක්‍රමය නිසා අවුරුදු හතරේ උපාධිය අවුරුදු පහකට දීර්ඝ වුණා.

ප්‍රඃ ඔබතුමාගේ දක්ෂතා හා කුසලතා හඳුනාගෙන ඒවා දියුණු කර ගැනීමට කටයුතු කළේ කොහොම ද ?

මම විශ්වවිද්‍යාලයේ ඉද්දිත් Public Administration විෂය සංගමේ උප සභාපති විදිහට කටයුතු කරා. ක්‍රීඩාවලට සම්බන්ධ වෙලා විශ්වවිද්‍යාල වර්ණ දිනා ගත්තා. දෙවන පෙළ ඉහළ උපාධියක් ලබා ගත්තා.

ඒ වගේ ම මගේ තාත්තා මට කියල තියෙනවා ලද පමණින් සතුටු වෙන්න. ඒ කියන්නේ විශේෂයෙන් ම පොලිස් නිලධාරියෙකු ලෙසට විශාල වශයෙන් අල්ලස් විදිහට මුදල්, මත්පැන් වගේ දේවල් ලැබෙනවා. එත් ලද පමණින් සතුටු වුණොත් මේ දේවලින් ඈත් වෙන්න පුළුවන්.

තව දෙයක් තමයි අනුන් ලබා ගන්නා ලද වැඩ නිශ්චිත නැත. අපිට තව කෙනෙක්ට වැඩ කරන්න දුන්නම අපි ඒ වැඩේ පෞද්ගලික ව අධ්‍යයනය කළ යුතු යි.

මම රාජකාරි කරන කාලයේ දී හිතට එකඟ ව වැඩ කළ නිසා ඉදිරියට යන්න උදවුවක් වුණා. ඒ වගේ සත්භාවයකින් වැඩ කිරීම තවත් ලොකු වැදගත් දෙයක් වුණා.

ප්‍රඃ ජීවිතයේ අරමුණු පිහිටුවාගත් ආකාරය හා ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ ආකාරය කිව්වොත් ?

අරමුණු පිහිටුවාගද්දී පැහැදිලි ප්‍රතිපත්ති තිබිය යුතු යි. ඒ වගේ ම අත්දැකීම් බහුල විය යුතු යි. මම කිව්වා වගේ A/L කරන කලේ ඉඳලා මට තිබ්බා පොලිස් සේවයට බැඳේන අදහසක්. ඉතින් මම ඒක වෙනුවෙන් කැපවෙලා වැඩ කළා. මොන දේ කළත් බෙල්ල බේරාගෙන වැඩ කරන්න පුරුදු වෙලා තිබුණා. නමුත් මට කවදාවත් පොලිස්පති වෙන්න අරමුණක් නම් තිබුණේ නෑ. එත් මගේ කෙලින් වැඩ කිරීම හා අවංක ව වැඩ කිරීම නිසා මට එතනට එන්න ලැබුණා.

ප්‍රඃ ජීවිතයේ අරමුණුවලට ගමන් කිරීම සඳහා විශ්වවිද්‍යාල සිසු-සිසුවියන්ට ඔබතුමා ලබාදෙන උපදේශය කුමක් ද ?

අරමුණු ඉටු කරගද්දි පැහැදිලි ප්‍රතිපත්ති තියෙන්න ඕන. අත්දැකීම් බහුල පුද්ගලයන් සමග සාකච්චා කොට තීරණ ගැනීම වගේ ම තවත් දෙයක් තමයි පළපුරුදු පුද්ගලයන් සමග සාකච්චා කොට තීරණ ගැනීම.

ඊළඟට හිතට එකඟව වැඩ කිරීම. හිතට එකඟව වැඩ කරනවා නම් තමන් අමාරුවේ වැටෙන්නේ නෑ. නමුත් තමුන් යටි අරමුණු ඉටු කරගන්න උත්සාහා කරනවා නම් අමාරුවේ වැටෙන්න පුළුවන්. ඒ වගේ ම කෙලින් වැඩ කරන විට තමුන් ආරක්ෂා වන ක්‍රමයට වැඩ කිරීමට සියලු දෙනා සිතට ගත යුතු යි.

ඒ වගේ ම හැම විට ම බලන්න ඕන, විශ්වවිද්‍යාලය තුළ සිටින අවුරුදු හතර තුළ කටයුතු කරන විට, සෑම විට ම කල්පනා කරන්න ඕන ඒක අපේ අනාගතයට බලපාන්නේ කෙසේ ද කියන එක. එනිසා තමන්ගේ ජීවිතයට අනතුරක් නො වන ලෙසට කටයුතු කිරීමට වග බලා ගත යුතු යි.

ප්‍රඃ සිවිල් සේවයට පැමිණීමට බලාපොරොත්තු වන සිසු-සිසුවියන්ට තව දුරටත් වර්දනය කර ගත යුතු සුදුසුකම් හා කුසලතා මොනවා ද? ඒවා වර්ධනය කර ගත යුතු වන්නේ කෙසේ ද ?

මූලික ව ගත්තහම වර්තමාන ජනසමාජය තුළ උපාධිධාරියෙකුගේ දැනුම උපාධියට පමණක් සීමා කරගෙන කටයුතු කරන්න බෑ. ජාත්‍යන්තර කටයුතු ගැන, දේශපාලනය ගැන වගේ ම සිංහල , දෙමළ භාෂාව වගේ ක්ෂේත්‍ර පුළුල් කර ගැනීම සම්බන්ධ වත් කටයුතු කළ යුතු යි.

ඒ වාගෙ ම පුවත්පත් කියවීම, අන්තර්ජාලය මගින් අංශ කිහිපයක් පිළිබඳ ව දැනුම පුළුල් කර ගැනීමට කටයුතු කිරීම, තවත් පාඨමාලාවන් හැදෑරීම, පරිඝනක තාක්ෂණය පිළිබඳ ව හදාරා තම දැනුම පථය වර්ධනය කර ගත යුතු යි.

විශේෂයෙන් ම උපාධිධාරීන් අනවශ්‍ය දේශපාලන කටයුතුවලට මැදිහත් නොවී ස්වාධින ව කටයුතු කිරීමට වග බලා ගත යුතු යි.

තමා ආදර්ශමත් ව කටයුතු කිරීම. ඒ කිව්වේ අයතා, නීති විරෝධී කටයුතුවලට මැදිහත් නොවී, මුලා නොවී කටයුතු කිරීමට සියලු ම දෙනා සිතට ගත යුතු යි.

තරුණ උපාධිධාරීන්ට විශේෂයෙන් ම කියන්නේ, දුර දිග බලලා කටයුතු කරන්න කියලා. හිතන්න ඔබයි රටේ අනාගතය කියලා.

සටහනඃ අසංක ජයතිලක





# විද්‍යුත් මාධ්‍යය සහ තරුණ පරපුර



නූතන විද්‍යුත් මාධ්‍යය නිසා ලෝකය වේගයෙන් නවීකරණය වී ඇති අතර මේ වන විට විශ්වයේ වෙසෙන මුලු ජන සංඛ්‍යාවෙන් සමහරක් විද්‍යුත් මාධ්‍ය වල මහිමයෙන් තම ජීවිතවල පැවැත්ම තහවුරු කරගෙන ඇති අතර සමහරෙක් තම ජීවිත මාරයාට බාර කර ඇත. දියුනු වන සමාජ ක්‍රමයත් සමඟ ඉදිරියට යන්නා වූ වත්මන් තරුණ සමාජ පරපුර නව තාක්ෂණික උපකරණ ශිල්පීන් හා නිර්මාණර්යන් සතුටින් වැළඳ ගැනීමට පෙළඹී ඇත.

රූපවාහිනිය යනු තරුණ පරපුර තුල වැඩි ආකර්ෂණයක් දිනා ගත් විද්‍යුත් මාධ්‍යයකි. වත්මන් පරපුර තුල ටෙලි නාට්‍යයක් නොබලන කෙනෙකු නොමැති තරමට නූතන ටෙලි නට්‍යය කෙරෙහි වත්මන් පරපුරෙහි ආකර්ෂණයක් රැඳී තිබේ. නූතන ටෙලි නාට්‍යය නිර්මාණයේ දී බොහෝ විට යොද ගන්නේ මනඃකල්පිත වූ සිද්ධීන් ය. එහෙත් තරුන පරපුර ඒවායෙහි චරිත තම ජීවිතයේ එදිනෙදා හමුවන මිනිසුන් සමඟ සසඳා බැලීම කොතෙකුත් දැකිය හැකිය. වත්මන් සමාජය තුල පවුල් සංස්ථාවන් කැඩී යාමට මෙය හේතුවක් වේ.

රූපවාහිනිය පමණක් නොව පරිගණක භාවිතය ද අද සමාජය පරිහානියට හේතුවක් වී ඇත. අපගේ ප්‍රගතිය උදෙසා හඳුන්වාදුන් පරිගණකය ඇතැමුන් තමන්ගේ විනශයට යොදා ගනී. පරිගණක තාක්ෂණය හරහා ලැබී ඇති විදේශීය වූ නිස්සාර පහත් බොලඳ දේවල් ඉත ඉහලින් වැළඳගෙන තම ජාතියේ හර පද්ධතීන් අමතක කර දැමීම මඟින් වත්මන් තරුණ පරපුරෙන් කොටසක් ඉවසීමේ ගුණය නොදත් ඉතා රලු පරුෂ ලෙස හැසිරෙන රට ජාතිය ආගම ගුණධර්ම නොහඳුනන විරුද්ධ මත නො ඉවසන පිරිසක් බවට පත්ව ඇත.

අතීතයේ ඒ ඒ ක්ෂේත්‍රයන් ට අදාල රැකියාවක් කළ ජන කොටස් එකිනෙකාට උදව් උපකාර කරමින් ඉතා සුහදශීලී ව තම රැකියවේ නිරත විය. වර්තමානයේ සියලු නිෂ්පාදන කර්යය නවීන උපකරණ වලට පවරා නිහඬ විය. තවද නිල බල ධන ලෝභයෙහි කෙලවරක් නොමැතිව නිපදවන නව තාක්ෂණ මෙවලම් මුලු ලෝකයට ම විනයක් වන තත්ත්වයට පැමිණ ඇත.

වර්තමානවෙ දෙතුන් දෙනෙකු ඉන්නා නිවසක පවා සුහදව එකට එකතු වී ආහාර වේලක් ගැනීමට පවා අද බාධකයක් වී ඇත්තේ එකිනෙකගේ කාමර වලට රිංගා ඇති නව තක්ෂණික මෙවලම් හා දවස තිස්සේ ඒවාට මුහුණ ඔබාගෙන සිටින පුද්ගලයන් රූකඩ බවට පත්ව සිටීමයි. නව විද්‍යුත් මාධ්‍යය, බුද්ධිමත් පිරිස තම දියුණුවට යොදා ගන්නා විට විද්‍යුත් මාධ්‍යයන්ගේ රූකඩයන් බවට පත් වූ තරුණ පරපුර එයින් තම දුර්භාග්‍ය ලඟා කරගැනීමට හේතු සකසාගෙන ඇත. විද්‍යුත් මාධ්‍යය හරහා මහජනයා ට සන්නිවේදන ක්‍රියාවලියෙන් වඩාත් හොඳින් සිදුවන අතර ඇතැම් අවස්ථාවන් වල දී එම කටයුතු රජයේ කටයුතු පවත්වාගෙන යාමට බාධා ගෙන දේ. කෙසේ වුව ද මාධ්‍යය සදාචාරය රැකගනිමින් විද්‍යුත් මාධ්‍යය ජාලයන් කටයුතු පවත්වාගෙන යාම රජයටත් රටේ සංවර්ධන ක්‍රියාවලියටත් තරුණ පරපුරේ යහපත උදෙසාත් හේතු වනු ඇත.

කාලයත් සමඟ මානව ශිෂ්ඨාචාරය ද පරිනාමයට පත්වීම ලෝක ස්වභාවය බව සත්‍යයකි. සමාජයේ ජනගහන වර්ධනයත් සමඟ ම තරඟකාරීත්වය ඇතිවීම සාමාන්‍යය වූවකි. එය එසේ උවත් කාලයක් තිස්සේ ශ්‍රමය කාලය හා ධනය වැය කොට නිපදවන නව නිර්මාණ තුලින් තම වර්ගයාට අයහපත උදාවන්නේ නම් එවැනි දේ නිෂ්ඵල කාර්යයන් බව වටහා ගැනීමට මිනිසාට වඩාත්ම උචිත කාලය දැන් එළඹී ඇත. සාරධර්ම වලින් තොරව සිත්පිත් නැති තාක්ෂණික මෙවලම් මත ජීවත් වීමට තැත් දැරීම මුලු මිනිස් සංහතියේ ම විනාශය බව අප කවුරුත් පිළිගත යුතු සත්‍යයකි. ඒ අනුව මිනිස් සබඳතා ශක්තිමත් කර සමාජ ආර්ථික සංස්කෘතික තත්ත්වයන් රැකගෙන රටක් සංවර්ධනය කිරීමට අවශ්‍යය පරිදි විද්‍යුත් මාධ්‍යය අර්ථාන්විතව හැඩගස්වා ගනීමේ වගකීම වත්මන් තරුණ පරපුර හමුවේ ඇති විශල අභියෝගයකි. මෙම මාධ්‍යය තම යහපත හා අන්‍යයන්ගේ යහපත උදෙස යොදා ගන්නේ නම් ලොව අතිශය සුන්දර තැනක් වනවාට නො අනුමානය.

එච්.එස්. මධුවන්ති පෙරේරා

## ජාතික සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ඒ ආශ්‍රිත ගැටලු

වේගවත් ආර්ථික සංවර්ධනයක් අත්කර ගැනීමට නම් රටකට ආර්ථික සංවර්ධන සැලැස්මක් අවශ්‍ය වේ. සැලසුම් කිරීමෙන් සංවර්ධන කාර්යය වඩා විධිමත් හා ක්‍රමවත් ආකාරයට සංවිධානය කර ගැනීමට හැකි වේ. එසේම සංවර්ධනයට අවශ්‍ය වන මූලික කරුණක් වන නවීකරණයෙහි එක් අංගයක් වශයෙන් ද සැලසුම්කරණය දැක්විය හැකිය. මේ අනුව යම් ජන කොට්ඨාසයකට සාම්ප්‍රදායික පැවැත්මෙන් මිදී නව මගකට යොමු වීම සඳහා සැලසුම් මගින් ඉඩ ප්‍රස්තාව සැලසෙයි.
ඇල්බට් වොටසන්ට අනුව සැලසුම් කිරීම යනු

''විශේෂිත අරමුණු ළඟාකර ගැනීම සඳහා ලබාගත හැකි හොඳම විකල්ප තෝරා ගැනීමට මනා අවබෝධයක් හා අඛණ්ඩ උත්සාහයකින් යුතුව සංවර්ධනය වීමයි. මේ අනුව යම් රටක සංවර්ධනය ඇති කිරීමෙහි ලා සැලසුම් සම්පාදනය මගින් පිටුවහලක් ලැබේ. මයිකල් ටොඩාරෝට අනුව ජාතික සංවර්ධන සැලසුම්කරණය යනු
''පරීක්ෂාකාරී රජයක් දිගුකාලීන ආර්ථික තීරණ ගැනීමට සහ සම්බන්ධීකරණය කිරීමට උත්සාහ දරන අතර, සමහර අවස්ථාවල දී වර්ධන මට්ටම පාලනය කිරීමටත් කලින් තීරණය කරන ලද සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමටත්, ආර්ථික ප්‍රතිපත්ති තුළින් ජාතියේ වර්ධනයක් ඇතිකර ගැනීමටත් කටයුතු කිරීම ය''.

ආර්ථික සංවර්ධනය සඳහා සකස් කරනු ලැබූ සැලසුමක පහත සඳහන් ලක්ෂණ පැවතිය යුතු ය.

- ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු හා ඒවා අතර සම්බන්ධතාවය පැහැදිලිව දැක්විය යුතු ය.
- දේශීය හා කාලය පිළිබඳ සැලකිල්ලට ගෙන ප්‍රතිපත්ති ප්‍රකාශ කළ යුතු ය.

මෙවැනි සැලසුමකින් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු අතර මූලික අරමුණක් වන්නේ වර්ධන අනුපාතතයට වඩා ශීඝ්‍රයෙන් ජාතික ආදායම වැඩි කිරීමට තරම් නිෂ්පාදන මට්ටමක් පවත්වාගෙන යාමට අවශ්‍ය අයෝජන කිරීම ය.
මෙහිලා ,
1. නිෂ්පාදනය වැඩිකිරීම සඳහා ආයෝජනය කරනු පිණිස සම්පත් ප්‍රමාණවත්ව එක්රැස් කිරීම
2. ආයෝජනයන් නියම අංශ වෙත යොමු කිරීම වැදගත් වේ.

මෙසේ යොමු කිරීමේ දී නිෂ්පාදනයේ වැඩි ශීඝ්‍රතාවයක් ද, ආර්ථික වර්ධනයේ ප්‍රමාණවත් සමබරතාවයක් ද පවත්වාගෙන යා යුතු අතර, අපතේ යාම වළක්වා සම්පත් ඉතා කාර්යක්ෂම අන්දමින් භාවිතය ඉතා වැදගත් වේ.

ආර්ථික සංවර්ධන සැලැස්මක් විධිමත් පරිදි සකස් කරනු ලැබ ඇත්නම් එය ඇතුළත් විවිධ අංශ අතර මනා සම්බන්ධීකරණයක් පැවතිය යුතු ය. එම අංශ එකට ගත් කල සම්පූර්ණ ක්‍රියාවලියක් වන සේ එකට එකතු කර තිබිය යුතු ය. විවිධ අංශ අතර සමබරතාවයක් තිබිය යුතු ය. සමස්ත ආර්ථික ම අරභයා සැලසුම් සකස් කිරීම මුලින්ම ආරම්භ කරන ලද්දේ සෝවියට් රුසියාව විසින් වන අතර දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ බොහෝ රටවල ආර්ථික සැලසුම් එම රටවල ප්‍රතිපත්ති මාලාවේ මූලික අංගයක් බවට පත් විය. ජාතික සංවර්ධන සැලසුම්වල ප්‍රධාන ලක්ෂණ පහත පරිදි දැක්විය හැකි ය.

1. රජයේ ප්‍රතිපත්තිවල අරමුණු ඉදිරිපත් කිරීම (උදා - ආර්ථික සංවර්ධනය)
2. මෙම අරමුණු ළඟාකර ගැනීම සඳහා උපක්‍රමයන් හඳුනා ගැනීම
3. සමස්ත ආර්ථිකයට බලපෑම් කිරීමට සහ තේරුම් ගැනීමට උත්සාහ දැරීම
4. ආර්ථිකය අපේක්ෂා කරන කාර්යඵල පුරෝකථනය කිරීමට සාර්ව ආර්ථික ආකෘතිය භාවිතයට ගැනීම
5. ජාතික සංවර්ධනයේ දිගුකාලීන දැක්මක් නිරූපණය වීම

- මෙය මධ්‍ය වාර ලේඛනයකි
- මෙයට අතිරේක වාර්ෂික සැලසුම් සම්බන්ධ වේ.

සංවර්ධනය කරා ළඟාවීම සඳහා බොහෝ රටවල් සැලසුම් සකස් කරන අතර ඒ සඳහා භාවිතා කරන ශිල්පක්‍රම ද ක්‍රමයෙන් දියුණු වෙමින් පවතී. පෙර පැවති තත්ත්වය අනුව රජය ආර්ථික සංවර්ධන කාර්යයට පුළුල් වශයෙන් රජය මැදිහත්වීම මෑත අතීතයේ සිදුවූ ප්‍රතිපත්තිමය වෙනසක් ලෙස දැක්විය හැකි ය. පෙර පැවති ක්‍රමය වූයේ එක් එක් ප්‍රශ්නය හෝ දුෂ්කරතාවය වෙන වෙනම සලකා බලා ඊට නිසි ප්‍රතිකර්ම එකිනෙකට අන්‍යෝන්‍ය වශයෙන් බලපාන නව ක්‍රමයේ ලක්ෂණයකි. සැලසුමක් සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ.

1. පූර්වානුමානය
2. අරමුණ තීරණය කිරීම
3. උපායමාර්ග නිශ්චය කිරීම
4. වැඩසටහන් සකස් කිරීම
5. සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය

"ඇල්බට් වොටසන් " පෙන්වා දී ඇති පරිදි සැලසුම් පහත ස්වරූපයන්ගෙන් සමන්විත වෙයි.

- රජයේ ඒකාබද්ධ සැලසුම්
- කෙටිකාලීන හා දීර්ඝකාලීන සැලසුම්
- ප්‍රගමන සැලසුම්
- වාර්ෂික සැලසුම්

සැලසුම් සම්පාදනය යනු හුදෙක් කාර්යක්ෂම අන්දමින් ඉලක්ක නියම කරගැනීම හා එම ඉලක්ක ක්‍රියාවට නැංවීමට අවශ්‍යයෙන් ම ඒකමතිකභාවය ගොඩනැගීම, තීරණ ගැනීම සහ කාර්යසාධනය මත පදනම් වූ දේශපාලනමය වූ ද, ආර්ථිකමය වූ ද ක්‍රියාවලියකි. සැලසුම් සම්පාදනයෙහි අන්තර්ගත කාර්යයන් පහත දැක්වේ.


1. සැලසුම් සකස් කිරීම
2. වැඩසටහන් සකස් කිරීම
3. සැලසුම් ක්‍රියාත්මක කිරීම
4. ප්‍රගති පාලනය
5. ඇගයීම

කොතෙක් සැලසුම් කළ ද සමහර සැලසුම් අසාර්ථක වනු දැකිය හැකිය. එසේ ම සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වනු ද දක්නට ලැබේ. යම් ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදනය නොකිරීම හේතුවෙන් පසුව මුදල් ප්‍රමාණවත් නොවීම, විධිමත් පරිදි සැලසුම් සකස් නොකිරීම යනාදිය අසාර්ථක වීමට හේතු පහත පරිදි දැක්විය හැකිය.


1. සැලසුම්වලින් බහුතරයක් ම ප්‍රමාණයට වඩා පුළුල් අභිලාශයන් පැවතීම
2. එවැනි සැලසුම් සඳහා නිවැරදි දත්ත ලබා ගැනීම අපහසු වීම
3. සැලසුම් සඳහා භාවිතා කරන විශ්ලේෂණාත්මක ක්‍රමවල අඩුපාඩු පැවතීම
4. අභ්‍යන්තර ව හා බාහිර ව ඇතිවන අනපේක්ෂිත අවස්ථාවන් වල දී සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම
5. දේශපාලන මැදිහත්වීම්

ශ්‍රී ලංකාවේ සංවර්ධන සැලසුම් සකස් කිරීම බොහෝ විට දේශපාලන නායකත්වය විසින් ගන්නා තීරණ මත සිදු කරනු ලබයි. ඔවුන් බොහෝවිට අවධානය යොමු කරනුයේ කෙටිකාලීන සංවර්ධන සැලසුම් කෙරෙහි ය. සැලසුම් සකස් කිරීමේ දී හා ඒවා ක්‍රියාත්මක කිරීමේ දී පවතින කැපවීමේ දුර්වලතා හේතුවෙන් ද සැලසුම් අසාර්ථක වේ. සංර්ධනය කරා යන ගමනේ දී ජාතික සංවර්ධව සැලසුම් සකස් කිරීමටත් ක්‍රියාත්මක කිරීමටත් දේශපාලන නායකයින් මෙන්ම රාජ්‍ය පරිපාලකයින් ද උත්සුක විය යුතුය.

එම්.ඒ.ටී. උදයංගනී
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යනාංශය
තෙවන වසර


Akushla Kulatunga
3rd year
Department Of Public Administration





Yenuli Dewmini
Grade 12
St. Paul's Girls School

### හිත රවටන මායාවයි ඇස් දෙක ගොඩ ගන්නේ.

පුතා
මේ ගස් කඳු හෙල් හැම අප පස්සෙන් දුවන්නේ
වලාකුළුත් හනි හනිකට අපට උඩින් දුවන්නේ
හදිස්සියක් දෝ මේ හැටි හැම දෙන මේ දුවන්නේ
මා හට නො තේරෙයි ඇයි සැම දෙන අප ලුහු බඳින්නේ

තාත්තා
පුතේ අනේ වටපිටාව නෙමෙයි එහෙම දුවන්නේ
අපි යනකොට අපේ ඇසට ගැටෙන දෙයයි පෙනෙන්නේ
ගස් වැල් හැම වලාකුළුත් අප පස්සෙන් නොඑන්නේ
හිත රවටන මායාවයි ඇස් දෙක ගොඩ නගන්නේ

තවත් මගියෙක්
වයසින් වැඩුණු පුතෙකුයි මෙලෙස මේ ගැන අහන්නේ
තාත්තෙ ඔබගේ පුතු මනසින් දුර්වල හැඩයිනේ
වෙද ගෙදරට රැගෙන ගියා නම් හනිකට හොඳයිනේ
ඔහුගෙ වයස සමගින් නැහැ ඔහුගෙ මනස වැඩෙන්නේ

තාත්තා
අපිත් එහේ ඉඳලයි මේ කෝච්චියට නගින්නේ
දවස් ගණන් වෙද ගෙදරයි පුතා එක්ක ගෙවන්නේ
විසි හත් වසර තමයි ඔහු මේ දැන් ගෙවන්නේ
ඒ මුළු විසි හත් වසටම අදයි ලෝකෙ දකින්නේ

තිලිණි මදාරා

## Strategies for Becoming a better Speaker

There are main components people must know in order to improve their presentation skills for better public speaking. The starting point in the art of public speaking is to pick a subject that you really care about.

*"Think, "What does the audience want to hear from me?*
*What can I provide that is of value to them?"*
*When you learn to speak in terms of the wants and needs of your audience,*
*you will become an effective, persuasive speaker."*
*~ Richard Lorenzen,*

There's a good reason that we say, "Practice makes perfect!" we simply cannot be a confident, compelling speaker without practice. We will need to practice our speech significantly in order to feel confident while speaking. Don't wait until the last minute to prepare or we will not feel ready to present. Instead of trying to memorize every word, only memorize the key points of our outline and the examples we will be using for support. You want to be engaged, not robotic-sounding. Your speech should flow naturally, as if you were having a conversation with another person. Practice, practice, practice: If you don't consider yourself to be a good presenter the only way to improve is to start presenting. Seek out opportunities at work. Remember, it's all practice. If this is your first presentation, keep in mind that it's not your last. Treat it as a learning opportunity. Don't expect to be perfect, but do give the best you can. Get to know your audience as well as you can. Find out exactly what they want from your talk, and give it to them. With any talk that you are giving, it is important that you know your subject. The general assumption of your audience is that you, as the subject matter expert, know about the topic more than they do, and that you are there to share knowledge and information that they do not know about yet. There is nothing more embarrassing than a speaker who does not do his homework, and who comes to a talk unprepared and with little knowledge about the topic. If you research and prepare adequately, that in itself will already boost your confidence level and lessen any apprehensions that you might have with giving the talk.

Whenever possible, record your presentations and speeches. You can improve your speaking skills dramatically by watching yourself later, and then working on improving in areas that didn't go well. As you watch, notice any verbal stalls, such as "um" or "like." Look at you; are you looking at the audience? Did you smile? Did you speak clearly at all times? Pay attention to your gestures. Do they appear natural or forced? Make sure that people can see them, especially if you're standing behind a podium. Does your face show surprise, hesitation, or annoyance? If so, practice managing interruptions like these smoothly, so that you're even better next time.

The opening of your presentation will determine how the rest of the speech goes, so speak with assertiveness and at a volume where everyone can easily hear you. Try opening with a strong statement and bold language in order to convey confidence. Remember that the audience has no prior opinions or thoughts on what you are going to say, and you are the authoritative source in this situation.

Stories help us to pay attention, and also to remember things. If you can use stories in your presentation, your audience is more likely to engage and to remember your points afterwards. It is a good idea to start with a story, but there is a wider point too: you need your presentation to act like a story. Stories have the greatest power to create connection. You can tell personal stories, stories from friends, movies, books or historical figures. Great speakers know how to use a story to create an emotional connection between ideas for the audience. Humans don't learn by listening to strings of facts. We learn from stories and examples. One of the best things you can do in a presentation is to tell stories. Make a point, and then put it into a real





situation.

It may be something you've experienced, something a colleague has, or your opinion about an issue. Your listeners will understand your point better, and you'll sound more credible. If you want your audience to remember your facts, frame them in the context of storytelling.

Stand up straight, with your legs shoulder width apart and your weight evenly distributed. Good posture reflects confidence and engagement with your presentation and your audience. To emphasize points. This tells the audience that something important is coming. It's also the hallmark of a confident speaker as only these are happy with silences. Nervous speakers tend to gabble on trying to fill every little gap. We are all uncomfortable when there is silence. Yet incorporating silence into your presentation can be a valuable tool causing the audience to be attentive to what you are going to say next.

Bad presenters keep their hands on the podium or in their pockets! Don't stand in one place glued to the spot hiding behind the podium! Good presenters will walk from side to side and look at different parts of the audience.

Throughout your presentation, it is important to make eye contact with individuals in the room. If you smile and make eye contact, you are building rapport, which helps the audience to connect with you and your subject. This helps to regulate the flow of communication. Speakers who make eye contact open the flow of communication and convey interest, concern, warmth, and credibility. Making eye contact with individuals gives them a sense of involvement in your presentation and helps to convey your objectives on a personal level. Make sure that you share eye contact with all members of a small audience and all areas of a large audience. Regularly shift your focus around the room, not so that you look nervous, but to help involve as many people as possible in your talk. The best speakers have eye contact with the audience. Pick one person in the audience and look at them for about 3 seconds while you are talking. Then switch to someone else, then someone else and keep going. You can probably look at or close to everyone during the course of your talk. Before you even begin to present, your audience will base their first impressions on your appearance. Make it count. Dress appropriate to the event. Be neat, clean, professional, and comfortable enough to act naturally. Smiling is a powerful cue that transmits happiness, friendliness, warmth, and liking. The movements of your eyes, mouth, and facial muscles can build a connection with your audience. Alternatively, they can undermine your every word. Eye focus is the most important element in this process.

The other elements of facial expression can convey the feelings of the presenter, anything from passion for the subject, to depth of concern for the audience. Get and keep their attention. Different people have different learning styles. Some learn by simply listening, some need to see it, and some learn best by experiencing it. If appropriate, try to fit all aspects into the presentation. Visual aides are a great way to keep your audience's attention. No matter what your medium (projector, flip chart, power point), it is important to remember a few rules about visual aids: Allow for some white space, don't fill the entire paper or slide with details or pictures; Use alternating colors for easier reading; and Visual aids support the presentation; do not use them as the entire presentation - be prepared to add commentary to the visual aids.

There is no one way to be a great speaker. Being a great speaker doesn't mean that you have to open with a joke or that you have to have highest quality photos in your PowerPoint.

Are you funny? Serious? Warm-hearted? Controversial? Pick what you are comfortable with and then make it your own. Keep within the time you've been allocated. This shows respect for your audience and keeps your talk succinct and on track. Your audience is more likely to pay attention if they know you're going to finish on time. Smiling gives a visual cue to your audience that you're worth

listening to.

**K.R.N.Harshani**
**Senior Assistant Librarian**
**Faculty of Applied Sciences Library**
**Rajarata University of Sri Lanka**
**wimukasi@yahoo.com**

## (දූ) සිල්වතියෝ

ඇඳ සුදු පිරුවට පෝදා පන්සලට යන
හරි බරි ගැසී බිත්තියකට වාරු ගෙන
බණ පදවලට සාදු හඬ න ග න
ගැහැණුන් සිල් ගනියි වටපිට බලා ගෙන

සිල් ටික අහවරය ගෙදරට යන ගමනේ
ඕපාදූප අහුරකි දොඩවන සද්දේ
ඇනුම් බැනුම් ඇදකුද සොයනා අස්සේ
පවසති අයෙක් වගතුග පෙරදා ටෙලියේ

සිල්පද අමතකය ඉන්ගත් පළක් නැතී
හතෙන් පසුව නරඹන ටෙලි පෙරහැරක් ඇතී
කෑම බීම දූ දරුවන් මතක නැතී
ඇස්කන් අයාගෙන ටෙලි පෙළ බලයි නිතී

පුබුදු මධුසංඛ ආරියරත්න
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
දෙවන වසර

## මා දුටු ඔබ

උතුම් පුරුෂයා උතුම් පුරුෂයා කියා කියනා හඬින්
ඇදීසිටියේ මාර්ගය තුළ වේදනා දුරුකරගනු රිසින්
අඟ පසඟ ඇති ගැහැණිය වෙත හීන් සීරුවෙ ඇදෙමින්
සතුටු වනවාද සොයුරිය ඔබ, ඔබට අත්වූ ඉරණමින්

කොළඹ ආවේ ගෙදර දොර ඇති අඟහිගකම් නිසා
නමුදු වූයේ තවෙකුගේ අහර වන්නට ඒ නිසා
දාස්වාරක් ඔබ හඬා ඇත කිසිත් කරගනු බැරි නිසා
කාට කියනුද කාට පෙනෙනුද සොයුරිය ඔබගේ දොසා

පුරුෂයාට ද ගැහැණියකට ද නිසි තැන සමාජේ ලැබුණි නම්
ඉඩක් තිබුණා වෙනස් වන්නට සොයුරිය ඔබට අත් වූ ඉරණම්
සතුටු වන්නට හැකිව තිබුණා උපාධියවත් ලැබුණි නම්
දුක දුටුවිට කවි ලියනු හැර කුමක් කරනුද පුංචි මං

දේවිනි නයනතාරා වරුෂවිතාන
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
ප්‍රථම වසර

## මා පැතූ ආදරය

මද පවනක් වී ළඟ දැවටුණු නුඹගේ
සිනහව සැමදා තිළිණියකි
අඳුරු මගේ ලොව අතරට පැයූ
හිරු මෙන් නුඹ මට ආලෝකයකි

පතනා පැතුමන් අතරෙ සිටින නුඹ
සැමදා දිදුලන තරුවකි
සසර පුරා මා පැතූ නුඹත්
මගේ ජීවිතයට සිහිනයකි.

අහඹු ලෙසින් නොසිතූ විලසින්
නුඹ මට සැමදා හිමිවෙන්න ඇතී
අමිල සෙනෙහසින් සොඳුරු වූ සිතින්
මා නුඹ හට ආදරේ කරන්නැති

ජේ.පී. දිනිති දිල්හානි ජයවීර
මූල්‍ය දෙපාර්තමේන්තුව





# ඵලදායී සේවකයන් රඳවා ගන්නේ කෙසේ ද?

ව්‍යාපාරයක්-ආයතනයක් මෙන් ම රටක්-සමාජයක් යන්නෙන් අර්ථවත් වන්නේ මිනිස් සමුදායක එකතුවකි. සමාජයක, රටක මෙන්ම ආයතනයක ද මූලික තැනුම් ඒකකය මිනිසා හෙවත් මානව සම්පතයි. රටක මානව සම්පත යනු හුදෙක් පුද්ගල සංඛ්‍යාව පමණක් නොවේ. එසේම ආයතනයක මානව සම්පත යන්නෙන් අදහස් වන්නේ ද හුදු සංඛ්‍යාත්මක සේවක මණ්ඩලය නොවේ. සේවකයන් තුළ ගොඩනැගී, තැන්පත් වී ඇති හැකියාවන්, ආකල්ප, දැනුම ආදී බුද්ධිමය සහ හැකියාමය ධාරිතාව ද ආයතනයක මානව බලයේ කොටසකි. එකී මානව සම්පත නිවැරදි ව කළමනාකරණය කරගැනීම ඕනෑම ආයතනයක සාර්ථකත්වයට බලපාන මූල සාධකයකි.

**වඩාත් පාථුලාර්ථයෙන් ගත් කල, නිවැරදි ව මානව සම්පත මෙහෙයවීම යනු, අසීමිත ආදරයෙන් මිනිසුන් පිදීම මිස අන් කිසිවක් නොවේ.**

දක්ෂ, ඵලදායී සේවකයන් ආයතන කෙරෙහි බඳවා ගැනීම තරමක් පහසු වූවත් වඩා අපහසු කාර්යය වන්නේ ඔවුන් ආයතනය සමඟ දීර්ඝ කාලයක් රඳවා ගැනීමයි. ඵලදායී සේවකයකු ආයතනය හැර යාම දැඩි පාඩුවකි. සේවකයකු ආයතනයෙන් ඉවත් වීම හුදෙක් භෞතික සේවකයා ඉවත්ව යාම නොවේ. එකී සේවකයා තුළ සමුච්චය වී ඇති දැනුම හා අත්දැකීම් ද සේවකයාගේ නික්ම යෑමත් සමඟ ආයතනයෙන් ඉවත් වේ. එය ඕනෑම මට්ටමක ආයතනයකට බලවත් පාඩුවකි. එසේම එකී අත්දැකීම් සම්භාරය සමඟ සේවකයා වෙනත් ව්‍යාපාරික තරඟකරුවකු සමඟ එක් වුවහොත් ඇතැම් විට එය ආයතනය වර්තමානයේ මුහුණ දෙන තරඟකාරී තත්ත්වය වෙනස් කරවීමට ද හේතු වේ. එබැවින් දක්ෂ, ඵලදායී සේවකයන් රඳවා ගැනීමට ආයතන කටයුතු කළ යුතු ය. නිවැරදි ව මානව සම්පත හැසිරවීම පිළිබඳ පළපුරුද්ද ඇති අයට නම් එය එතරම් අපහසු කාර්යයක් නොවේ.

**අද බොහෝ ආයතන අම්බලම් වැනි ය. සේවකයන් යාචකයන් වැනි ය. ඉතා කෙටි කාලයක් සඳහා යම් ආයතනයකට පිවිසෙන ඔවුහු ඉන් යමක් රැගෙන, පැමිණි වේගයටත් වඩා වේගයෙන් එම ආයතනය හැර යති. තවත් එවැනි ම ආයතනයකට නැවත පිවිසෙති. පෙර සිදු කළ දෙයම සිදු කරති.**

ශ්‍රී ලංකා ආර්ථිකය තුළ, වාර්ෂික නිෂ්පාදන ධාරිතාවෙන් (ජාතික නිෂ්පාදිතයෙන්) හතරෙන් තුනකටත් වඩා වැඩි ප්‍රමාණයක් සපයනු ලබන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසිනි. ඒවා බොහොමයක් ශ්‍රම සූක්ෂ්ම තත්ත්වයේ පවතී. එසේ ම ඒවා යැපුම් මට්ටමේ සිට ව්‍යාපාරික මට්ටම දක්වා වර්ධනය විය යුතු අවස්ථාවේ ද පවතියි. එබැවින් සේවක සම්පතේ ශක්තිය ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට වඩාත් තීව්‍ර ව දැනේ.

මෙම ලිපියෙන් විවරණය කෙරෙන්නේ ඉහත සඳහන් කළ පරිදි ආයතනයකට ශක්තියක් විය හැකි, ඵලදායී දක්ෂ සේවකයන් ආයතන තුළ රඳවා ගනිමින් ඔවුන් ව්‍යාපාරික ප්‍රගතිය උදෙසා මෙහෙයවිය හැකි සාර්ථක ක්‍රම පහක් පිළිබඳවයි. සේවක රඳවා ගැනීම ඉහළ නැංවීම සඳහා අනුගමනය කළ හැකි, සාර්ථක ව්‍යවසායකයන් විසින් අනුගමනය කරනු ලබන එම උපායමාර්ග පහ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට වඩාත් විශේෂිත වන පරිදි ගෙනහැර දක්වමින් සංවාදයක් ගොඩ නැගීම මෙම ලිපියේ මුඛ්‍ය පරමාර්ථය වේ.

### සාර්ථක උපායමාර්ග පහක්

### 1. සේවකයන්ට ලබාදෙන මූල්‍ය ප්‍රතිදාන පිළිබඳ වඩාත් සැළකිලිමත් වන්න

මිනිසා ආර්ථික සත්ත්වයකු බව නො රහසකි. ඉන් අදහස් වන්නේ මිනිසා තමාට ලැබෙන ප්‍රතිදාන කෙරෙහි වඩාත් සංවේදී වන බවයි. ඒ අතර මූල්‍ය ප්‍රතිදාන සුවිශේෂී වේ. ඵලදායී දක්ෂ සේවකයන්ට පහසුවෙන් වෙනත් රැකියාවක් හෝ වෙනත් රැකියා ස්ථානයක් සොයාගත හැක. ඊට හේතුව ඔවුන්ගේ දක්ෂකම යි. එබැවින්, වඩාත් ආකර්ෂණීය මෙන්ම ජීවන වියදම ආවරණය කරගත හැකි තරම් මූල්‍ය සංරචක සහිත ප්‍රතිදාන ව්‍යුහයක් පවත්වාගෙන යාම ඵලදායී දක්ෂ සේවකයන් රඳවා ගැනීම සඳහා අතිශයින් වැදගත් වේ.

### 2. සේවකයා ඉටු කරන රාජකාරිය හැකිතාක් පහසු කරන්න

කාලය වෙනස් වේ. කාලයත් සමඟ බොහෝ දේ වෙනස් වේ. එය සාමාන්‍ය මිනිස් ස්වභාවයයි. එනිසා, වර්තමානයේ ඉතා කැපවීමෙන් වැඩ කරන පක්ෂපාතී සේවකයකු වුවත් අනාගත යම් දිනෙක තම රාජකාරිය හෝ වැඩ පරිසරය ජීවිතයේ අනෙක් පැතිකඩයන්ට (පවුල් ජීවිතය, සමාජ සම්බන්ධතා පවත්වා ගැනීම ආදිය සඳහා) බාධාවක් සේ දැකිය හැකිය. එවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට නම් රාජකාරිය හැකිතාක් පහසු කළ යුතු ය. රැකියාව සාර්ථක ව ඉටු කිරීමට අවශ්‍ය සම්පත් (යන්ත්‍ර, උපකරණ, මූල්‍ය, තොරතුරු ආදී) ලබාදීම තුළින්, අධිකාරීත්වය පවරාදීම තුළින්, අවශ්‍ය පුහුණුව ලබාදීම තුළින් සේවකයාගේ රාජකාරිය පහසු කරවිය හැකිය. බොහෝ සාර්ථක සේවායෝජකයන් සේවක තෘප්තිය වර්ධනය කිරීමේ උපායමාර්ගයක් ලෙස ද මෙය අනුගමනය කරනු දැකිය හැකි ය.

### 3. තම රාජකාරිය සහ ආයතනය පිළිබඳ අයිතියක් සහ හැඟීමක් සේවකයන් තුළ ඇති කරන්න

තම රාජකාරිය පහසු වනවා මෙන් ම එය අර්ථාන්විත ද විය යුතුය. රැකියාවට පැමිණීම නිරර්ථක බව හෝ එය කාලය නාස්ති කිරීමක් බව සේවකයාට සිතේ නම් ඉන් පෙනී යන්නේ රැකියාවේ රාජකාරි අර්ථාන්විත නො වන බවත්, ඒවා ඉටු කිරීමෙන් කිසිඳු දෘශ්‍යමාන ප්‍රතිඵලයක් නොලැබෙන බවත් ය. එවැනි ගැටලු ඇති නො වීමට නම් තම රාජකාරිය පිළිබඳ මුල සිට අග දක්වා වගකීම සේවකයාට ලබා දිය යුතු ය. ආයතනයේ සාර්ථකත්වය වෙනුවෙන් තම රාජකාරිය දායක වන ආකාරය සේවකයාට පැහැදිලි විය යුතු ය. එසේම, තම ජීවිතයෙන් වැඩිම කාලයක් ගත කරන රැකියා ස්ථානය තම දෙවන නිවහන මෙන් සේවකයාට දැනෙන්නට සැලැස්විය යුතුය. එමඟින් රාජකාරිය සහ ආයතනය පිළිබඳ අයිතියක් සහ හැඟීමක් ජනිත කරවිය හැකි ය.

**4. අවශ්‍ය සියලු තැන්හි දී අගය කිරීම සහ පිළිගැනීම සේවකයන්ට ලබා දෙන්න**

මිනිසා ආර්ථික සත්ත්වයකු මෙන්ම සමාජ සත්වයෙක් ද වේ. රැකියා පරිසරය සංකීර්ණ සමාජ පද්ධතියක් වේ. රැකියා පරිසරය නැමැති සමාජ පද්ධතිය තුළින් ඉටු කර ගැනීමට උත්සාහා කරන මානසික අවශ්‍යතා සහ සමාජීය අවශ්‍යතා රාශියක් සෑම සේවකයකුට ම තිබේ. අගය කිරීමට සහ පිළිගැනීමට පාත්‍ර වීම ඉන් එක් ප්‍රබල අවශ්‍යතාවකි. දක්ෂ සේවකයන්ගේ දක්ෂතා සහ ඔවුන් ආයතනයේ සමස්ත සාර්ථකත්වයට උරදෙන ආකාරය, ආයතනය වෙනුවෙන් ඔවුන් කර ඇති කැප කිරීම් ප්‍රසිද්ධියේ අගය කළ යුතු ය. ඒවා වෙනුවෙන් නිර්ලෝභී පිළිගැනීමක් ලබා දිය යුතු ය. එය අව්‍යාජ අගය කිරීමක් නම් එමඟින් අන් සේවකයන් ද වඩා වැඩි කාර්ය සාධනයක් ජනිත කිරීමට පෙළඹවිය හැකි ය.

**5. ආයතනය සේවකයන්ගේ ජීවිතයේ කොටසක් බවට පත් කරන්න**

තම සේවක මණ්ඩලය ආයතනය වෙනුවෙන් කැපවනු දැකීම, පක්ෂපාතීවනු දැකීම සෑම සේවා යෝජකයකුගේ ම බලාපොරොත්තුවයි. නමුත්, ආයතනය සේවකයන්ගේ ජීවිතයේ කොටසක් බවට පත්නොවී සේවකයන් ආයතනයේ කොටසක් වීම අපේක්ෂා කළ නො හැකිය. සේවකයාගේ පවුලේ සාමාජිකයන්ගේ චිත්ත සන්තානය තුළ පවා ආයතනය පිළිබඳ ආකල්පය වර්ධනය කරවිය යුතු ය. බොහෝ ආයතන මෙවැන්නක් සඳහා යොදා ගන්නේ විවිධාකාරයේ සුභසාධන ප්‍රතිලාභ ය. නමුත්, හුදෙක් සුභසාධන පහසුකම් සැලසීමෙන් පමණක් නො නැවතී ඉන් මදක් ඔබ්බට ගොස්, සේවකයාට සේවකයකු ලෙස නොව මනුෂ්‍යයකු සේ සැළකීම වැදගත් ය. සේවකයන්ගේ ජීවිතයේ සෑම සැතපුම් කණුවක දී ම ආයතනය ඔවුන් සමඟ සිටී නම්, සේවකයන් ද ආයතනයේ සෑම සැතපුම් කණුවක දී ම ආයතනය සමඟ සිටිනු ඇත.

ඵලදායී දක්ෂ සේවකයකු ආයතනය හැරයාම පක්ෂපාතී පාරිභෝගිකයන් සිය දෙනෙකු ආයතනය හැර යාමට සමාන ය. එවැනි ඵලදායී සේවකයන් දෙදෙනෙකු ආයතනය හැරයාම වෙළෙඳපොළෙන් අඩක් බිඳවැටීමට සමාන ය. එවැනි ඵලදායී සේවකයන් තිදෙනෙකු ඉවත්වීම ආයතනයේ කොටසක් වසා දැමුවා හා සමානය. එවැන්නන් සිවු දෙනෙකුගේ නික්ම යෑම සමස්ත ආයතනය ම වසා දැමීමට ගත් තීරණයක බරපතලකමට සමානය. දක්ෂ ඵලදායී සේවකයන් රඳවා ගැනීමේ වටිනාකම එයින් ම සපථ නොවන්නේ ද?

තරිඳු ධනංජය වීරසිංහ
කථිකාචාර්ය
මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

## පැතුම

නිමා කළෙමි දහතුන් වසක
පාසල් දිවිය
ලදිමි එහි අග්‍රඵලය
ලැබීමට වරම් සරසවියේ
දනුනා එදින මට
ජයගත්තා සේ මුළු ලොවම
දුටුවිට නෙතඟ සතුටු කඳුළු
ආදර අම්මා තාත්තාගේ
කරමි ඉදිරියටත් සැබෑ, මම
ඔවුන්ගේ සිහින
එළිය කරමින් ලෝකයම
එයයි පැතුම මා දිවියේ......

ජී.කේ. චරිණි යසාරා ගන්නෙරුම
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
ප්‍රථම වසර





## It is just not a game...

It is not just a game
It shows the way of life
How,
Your victory will depend on
the sum of your choices....
Sometimes,
You'll have to move backwards
To take a better step foreward....
There are times,
when a well-placed pawn
is more powerful than the king....
Although,
King is important
Queen is powerful....
Whatever the general things
king need a queen
to protect him....
But,
the real truth
we should keep in mind is,
after the game
the king and pawn
go in to the same box....
However,
We should not be a chess piece
We should be the chess player....
In our life....
It is 'Chess'
that gives lessons for life....



**W. Nadeeshani Sellahewa**
3rd Year
Department of Public Administration

## අඩිපාර

රිදී හිරු සොයා යන
කටුක අඩි පාර දිගේ
බලාපොරොත්තු මල් දෙපස සුපිපුණත්,
සුමට ගල් ඇල්லූ මඟක් නම් නොමැතේ
දෙපා, හිත රිදුම් දෙන
බොරලු වැටි පමණි ඇත්තේ
සුමුදු මල් අතර නපුරු මල් ඇත්තේ
නමුදු,
සුමුදු මල් පමණි නෙලා ගත යුත්තේ
නපුරු මල් ලැබුණොත් දුකකි හිමි වන්නේ
එසේ නම්, සුමුදු මල් සුවඳ ගෙන
නපුරු මල් මුකුලිත කිරීමට කාලයයි මේ.
මන්ද,
ජීවිත අඩිපාර නොමැත යලි හැරෙන්නේ .....

එච්.ඒ.එන්. හිරියාදෙනිය
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
දෙවන වසර

## සොයුරු පෙම



ළඟ ඉද්දි උරණ වන
දුර ඉද්දි ඔඩු දවන
අපූරුම ප්‍රේමයකි
සොයුරු පෙම

හිනහෙද්දි සතුටුවන
හඬද්දිත් දුක දනෙන
නොතනියට ළඟ රැදෙන
සෙනේදම

ලෝකයක් විරසකව
ඔබ එහිම තනිකළත්
හැරදමා දුර නොයන
සැනසීම

හෝඩියම ගැලපුවත්
හරිම අරුතක් දෙන්න
කවියකට හැකිනොවන
අරුම කිම

එච්.එම්.අයි.යූ.පී. හේරත්
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
තෙවන වසර

## සරසවිය

*දිවා රෑ නොතකා*
*අදිටනින් පෙරට ගොස්*
*සියලු දේ හැරදමා*
*පොතපතින් දැනුම ලැබ*
*විභාගය ජයගැනුම*
*එකම මග විය*
*සරසවිය මගේ කර ගැනුමට*
*හිතට ලොකු ප්‍රීතියක්*
*ගතට ලොකු ශක්තියක්*
*දැනුනි කිසිදාක මෙන්*
*පින්බිමට පියනැගූ*
*ඒ මගේ මුල් දිනේ..*

එච්.ආර්.ඒ. සතුරි වින්දුලා
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
ප්‍රථම වසර

## ජීවිතය

විටෙක හඬයි, විටෙක සිනාසෙයි
ජීවිතය,
නුබේ අර්ථය කුමක්දැයි ...
බලාපොරොත්තු සිහින පොදි වැඳන්
ලෝභය, ක්‍රෝධය. තණ්හාව උතුරා ගෙන
තවත් අයෙකුගේ දුක, බඩගින්න, අසරණකම
මායිම් නොකරන
තමන්ගේ බඩ ගෝස්තරය පමණක්
පුරවා ගන්නට වෙර දරණ
හැම තත්පරයකම ආසාවන් තමන් සතුකරගන්නට
තැත් කරන ජීවිතය
අවසානයේ කුමක් රැගෙන යන්නද කල්පනාව

ජේ.ජී.පී.එස්. ජයරත්න
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
දෙවන වසර





## අම්මා

| | |
|---|---|
| පොළෝ තලය සිප ගන්නා දුහුවිලි | අතරේ |
| අහස් කුසට දනෙනා මද | පවනේ |
| පොඩි අඩි තබා ආ මේ දිවි | ගමනේ |
| මා පසු පස ආවේ නුඹමයි | අම්මේ |
| ජීවිත පෙරලියේ දුක් දොම්නස් | මැද්දේ |
| අත් වාරුව වී සිටියේ නුඹමයි | අම්මේ |
| දේදුනු පාටින් මගෙ දිවි මග හැඩ | කෙරුවේ |
| බුදු හිමි පා නැමැද පතනෙමි දීඝායු | අම්මේ |

ඊ.පී.ජී.කේ. වීරසිංහ
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
දෙවන වසර

## පෙම්බර පතිනි

මේ දිවි ගමනේ
අසීරු සැමතැන්
පසුකර යන්නට
මා පැතුවේ ඔබේ සවියයි ...... දිරියයි .....
දුටු මුල් දිනයේ
හදවත් එක් වී .......
අතැඟිලි බැඳි අපේ
පතිනිය වී මගේ ......
වදන් දුන්නේ ඔබ
ආත්ම ගණනක් මගේම වන්නයි ...
අපේ කිරිකැටි පුතු
දෑතට දී මගේ
අම්මා යන උත්තම පදවිය ලැබ
යන්නට සිතුවේ ඇයි අප තනිකර
දනිමි මම එක් දෙයක්
ගියත් අප ඈතැර නුඹ
එදා දුන් ඒ වදන
නැතේ කිසිදා කඩකළේ ...
පුතුගේ සිනහව නුඹයි
දෑසින් පෙනෙන්නේ ඔබේ රුවයි
කිරිකැටි මුවින් මා අමතන්නේ
ඔහු නොව ඔබයි
මගේ පෙම්බර පතිනි
ජීවත් වෙමි මෙදින මම
සිහිකර නුබේ මතකය පුතු හා සමඟ

නඳුන් පින්සර
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
ප්‍රථම වසර

## වගකීම

පෙරපාසල් යන විට ඔබ හා එදිනා
සිතුවේ නෑ මෙපමණ දුර මා ගෙන යයි කියලා
පාසල් ගියේ ඔබේ පා පැදියේ නැගලා
මාව දමාගෙන ඔබ පැගුවෙ වෙර දමලා

කොල්ලන් මුකුලු කලෙ පුටර් එකය කියා
නොසැලුනි හිතින් තාත්තගේ වචන නිසා
ගන්න දුවේ කාර් එකක් මතු දිනෙක ඔයා
යනවාමයි රවුමක් එදින මෙමා

මුදල් නොමැති කල දිවියක් නොමැති නිසා
අම්මා ගියා පිටරට සිහින ගොඩක් තියා
ලෙඩක් දුකක් හැදුනද දරුවට එකලා
පියා තමයි සිටියේ දුක සැප බලලා

ඉගෙනීමෙදි හැමදාමත් පළවෙනියා
දක්ෂ ලෙසින් පිය පැතුමන් ඉෂ්ඨ කලා
සරසවි වරම් සිහිනයක් ද මා සිතුවා
ඔබ හරි පියාණනි මා එය ජය ගත්තා

වැටුණු වැටුණු විට මා නැගිට්ටුවා
මව ළඟ නොමැති අඩුව දුරුකරලූවා
ඔබේ ආදරෙන් මා හැම දේ ජය ගත්තා
මතු ආත්මෙදිත් ඔබ වේවා මගේ පියා

ළමයි මරා සැනසෙන පියවරු අතරෙ
ඔබ වැනි රජෙක් තම විය නොහැකි මෙලොවේ
ඇත සිහිනයක් රජ කරවීමට මෙලොවේ
රජ කරවා මිස පසු නොබලමි පියාණනේ

එම්. ලක්මිණි සඳරුවනි ප්‍රනාන්දු
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
ප්‍රථම වසර

# Public sector corruption in Sri Lanka

Corruption is a form of unethical conduct by a person with a position of authority, often to acquire personal benefit. Corruption may include many activities including bribery and embezzlement. Government or political corruption occurs when an office holder or other governmental employee acts in an official capacity for personal gain.

Public sector corruption includes corruption of the political process and of government agencies such as the police as well as corruption in processes of allocating public funds for contracts, grants and hiring. Recent research by the World Bank suggests that policy makers such as elected officials or bureaucrats can be critical in determining the level of corruption.

According to the annual Global Corruption Index by Transparency International, Sri Lanka has scored 40 points and is placed in the 79th position among 176 countries. Countries like Tunisia and Rwanda are better than Sri Lanka when it comes to corruption in the public sector.

Education, health, power/energy, land administration, police, judiciary and ministry of samurdhi/social service department are the major corrupt sectors in Sri Lankan public service.

Following data represent the percentage of corruption of these sectors according to Corruption survey 2001 - 2002.

| Sector | % |
|---|---|
| Education | 4 |
| Health | 4.9 |
| Power/energy | 0.8 |
| Land Administration | 1.4 |
| Police | 30.5 |
| Judiciary | 2.4 |
| Ministry of Samurdhi | 4.3 |

According to the survey results police is the most corrupted sector in Sri Lanka (30.5%). One common form of police corruption is accepting bribes. Corruption in admissions to universities is traditionally considered as one of the most corrupt areas of the education sector. Judicial corruption refers to corruption related misconduct of judges, through receiving or giving bribes, improper sentencing of convicted criminals, bias in the hearing and judgement of arguments and other such misconduct.

One of the most notable cases in public sector corruption, when the North Central Province Road Development Authority (NCP RDA) interdicted two of its highest ranking officers and started investigating allegation of massive corruption prior to the Deyata Kirula exhibition in 2012. The transparency International had revealed that over 3000 million rupees had been swindled during the construction and development of roads by the NCP RDA prior to the exhibition.

Another one is Rathnapriya charged that the power minister at the time John Senevirathna had not been aware of the sampur agreement and that Sri Lanka had entered into the agreement with an Indian company without the approval of the CEB board of directors. He said that while the agreement claimed the sampur plant would run at 40% efficiency but the actual efficiency of the plant was 35% resulting in losses of between 2.6 and 4.9 billion rupees.

Causes for these kinds of corruptions are higher level of market and political monopolization, low press freedom, low economic freedom, gender inequality, large ethnic division, higher level of bureaucracy, inefficient administrative structures, weak civil participation, low political transparency etc.

In the present this becomes a huge problem in Sri Lankan public sector. It effects on people, society and economy. Effects of corruption on people are lack of quality in services, lack of proper justice, chances of unemployment, poor health and hygiene and pollution. Effects of corruption on society are disregard for officials, lack of respect for rulers, lack of faith and trust on the government etc. Effects of corruption on economy are decrease in foreign investments, delay in growth, lack of development and differences in trade ratio's.





Because of these effects corruption is highly affected to the every fields of the country. To prevent from these effects Sri Lanka needs institutional reforms such as increase efficiency of public sector, accountable governance, implement laws against corruptions, provide a fair and adequate payment for public servants, encouraging ethical living patterns as well as societal reforms are needed such as reduce cost of living, educate the people in the country, create a morale society and ensure equal rights. By following these reforms and changes Sri Lanka able to reduce the corruptions related to public sector.

**Thilini Samaraweera**
3rd Year
Department of Public Administration

**සෙනෙහස .....**

මා සෙමි සෙමින් අතපය ටික සොලවද්දී
නුඹ හිනැහෙන්න ඇති සතුටින් ලොකු වෙද්දී
ලස්සන සිහින මා වෙනුවෙන් ගළපද්දී
කඩුපුල් මල් පිපෙන්නැති රෑ එළිවෙද්දී...

දුක් කම් කටොළු බාධා දස දෙසින් නැගී
එන්නැති නුඹේ නෙත් එකිනෙක බොඳ කරදී
දහඩිය කඳුළු. අත් කර ගැට මතු වෙද්දී
නුඹ නැහැ නැවතුනේ කිසිදා දෙකට නැවී

හරි දේ වැරදි දේ මා හට පවසද්දී
හරි මඟ යන්න මා පසුපස නුඹ ඉද්දී
නැහැ දැනුනේ බියක් සැකයක් කිසිවිටදී
නැහැ තනි වුණේ දෙගුරුනි මා නුඹ ඉද්දී

නුඹේ ආසිරි පැතුම් මට සවියක් වෙද්දී
මා ලොව දිනම් කෙදිනක හෝ බියක් නැතී
මතු භවයේ දිනෙක දෙගුරුනි නුඹ ඉද්දී
මා පුතු වෙන්න පතනෙමි නුඹ බුදු වෙද්දී

එල්.ඩී. රංසි මධුභාෂිණී කරුණාරත්න
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
තෙවන වසර

***Path to success***

Be true to your heart
Never be dishonest
Be a flower among harmful
Thank others prickles
While thinking yourself
Be a good citizen
To your Motherland

You aren't always the best
There will be many who are better
You aren't always the worst
There will be many who are worse
So don't be sad
About who you are
Be happy and lively
And make around you so

Choose the correct path
And leave the others
At every hard time you'll have
Be brave and tenacious to face
Never cry for loss
Always smile to gain
Try to be as I've told you
And your future will be very successful

**H. Sudeepa Madhuwanthi Perera**
3rd year
Department of Public Administration

## නැගී එන ජාතිවාදය හා ආගම්වාදය

බොහෝ දෙනෙකු අවසාන කළ නොහැකි යැයි පැවසූ තිස් වසරක යුද්ධය අවසන් ය. තැන් තැන් වල සිදුවන බෝම්බ පිපිරීම්, මිනිසුන් තම ගම් බිම් හැරදා අනාථයින් ලෙස ජීවිතය රැක රැකීමට වෙහෙස වූ ශ්‍රී ලංකා මාතාවට විශාල කළු පැල්ලමක් එක් කළ එම අඳුරු යුගය දැන් අවසන් ය. යුද්ධයක අවසානයේ පැවතිය යුත්තේ සාමය නමුත් අප පැතූ එම සාමය රටට ලැබී ඇත් ද යන්න ප්‍රශ්නාර්ථයකි. වර්තමානය වන විට ජාතිවාදය හා ආගම්වාදී ක්‍රියා නැගී එන්නේ අප පැතූ එම සාමය සිහිනයක් බවට පත් කරමිනි.

ශ්‍රී ලංකාව යනු බහුජාතික හා බහුවාර්ගික රාජ්‍යයකි. එමෙන් ම තවමත් දියුණු වෙමින් පවතින ආර්ථිකයක් පවතින රටකි. කලක් ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති රාජ්‍යයකි. මෙම යටත් විජිත පාලනය කිරීම සඳහා යටත් විජත පාලකයන් ජාතීන් භේද කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් පාලන කටයුතු ගෙන යන ලදි. ශ්‍රී ලංකාව යටත් විජිත භාවයෙන් කළ ජාතීන් භේද භින්න කිරීමේ පිළිලය වර්ධනය වෙමින් පවතී. ජාතික සමගිය විනාශ කරන ක්‍රියා ලෙස අන්තර්ජාලය ඔස්සේ ප්‍රචාරය වන ගැටුම් සඳහා තුඩු දෙන අදහස් ප්‍රචාරණය, ඇතැම් දේශපාලකයින්ගේ වැරදි සහගත ප්‍රකාශ සුළු ජාතික ව්‍යාපාර වලට හා ආගමික ස්ථානවලට වලට කරන පහරදීම් උදාහරණ ලෙස දැක්විය හැකිය. මෙම ගැටුම් නිර්මාණය කරනයේ අවිනීත, අශිෂ්ට, නීතිගරුක නො වන සුළුතර පිරිසක් විසිනි. හුදෙක් ඔවුන්ගේ පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා පමණි. මෙම තත්ත්වය මැඩලීම සඳහා නීතිය පමණක්ම ප්‍රමාණවත් නොවේ. මන්ද නීතිය මගින් කළ හැක්කේ එම තත්ත්වය පාලනය කිරීම විනා ගැටුම් ඇතිවීම වැළැක්වීම නොවේ. ආගමික නායක, දේශපාලකයින්, මාධ්‍යවේදීන් මෙන්ම නීති ගරුක පුරවැසියන් ලෙස අප හට ද මෙම ආගම්වාදී, ජාතිවාදී ගැටුම් වළක්වාගැනීමට පුළුවන. එසේ කිරීමට අප අපොසත් වුවහොත් නැවතත් රට සිවිල් යුද්ධයක් කරා යන ගමන් මඟ වැඩි ඈතක නොවන බව පසක් කර ගත හැකිය. "ජාතිවාදය බුද්ධියට නොව, හැඟීම් වල මුල් තැන දෙනු ලබන මිත්‍යාවක් '' සොරල්

එම්.ඒ. මියුෂා රොමේනි පෙරේරා
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
තෙවන වසර

## නොසන්සිඳෙන පිපාසය

පොත් මිටියයි සුදු ගව්මයි
පැතුවෙ එකම සිහින ගෙයයි
ඒ සිහිනය කෙදිනක හෝ
ජය ගැනුමයි ''සරසවි'' බිම
සොඳුරු සිහින පොදි බැඳගෙන
පියනැගුවේ කඩයිම් පෙල
අවසානයෙ සිහින පියස
මගෙ නිවහන විය මා හට
නොතේරුනේ එකම දෙයකි
කෝ අප සෙව් සොඳුරු සිහින
යහළු යෙහෙලියන් රැසකුයි
හිතේ ලොකුම වැඩගොඩකුයි
Class 1යි GPA
ප්‍රධාන තීරක වීලා
සොඳුරු සිහින බොඳවීලා
නව පැතුමන් එක් වීලා
හොඳ රැකියාවක් සෙවීම
ඊළඟ අරමුණ වීලා
ජීවිතයේ ගමන්මගේ
අවසානය නොපෙනෙන්නේ
දිනෙන් දිනේ අලුත් වේවී
අරමුණු පොදි බැඳගන්නේ
පිපාසයෙන් හතිදමමින්
ඒ පසුපස දුවයන්නේ
විඩා නිවන ගිමන් හලක්
කෙදිනකදෝ හමුවන්නේ...

එච්.ඒ.එන් හිරියාදෙනිය
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
දෙවන වසර

## පිය සෙනෙහස

පියාණනි,
විමසිලිමත්ය
ඔය දෑස
දුර මෙන්ම ළඟද
පැහැදිලිව පෙනෙන .....
නුඹේ
ඔය
නෙත් දෙකෙන්
කර්කශව
කේඩැරි වී ගිය
අපිගේ නෙත්වලට
කියාදෙනු මැන
බලනයුරු
දුර මෙන්ම ළඟද
එකලෙසින් .....

ඩබ්.ඩී.සී. මධුෂාණි ජයරත්න
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
දෙවන වසර





## Information and Communication Technology usage in Public sector

There are seven production factors in a production process such as land, labor, entrepreneur, capital, information, people and time. Among them, information is a main production factor. Today, in the globalized and digitalized society Information and Communication Technology (ICT) plays a major role. . As a result of that, ICT has become the essential technology required for information processing, in particular, the use of electronic computers, communication devices and software applications to convert, store, protect, process, transmit and retrieve information from anywhere, anytime. For providing a better service, ICT should use in private sector as well as public sector. Therefore, this article intends to discuss about ICT usage in public sector in the world and the Sri Lankan context.

ICT refers to technologies that provide access to information through telecommunications. It is similar to Information Technology (IT), but focuses primarily on communication technologies. This includes Internet, Wireless networks, Cell phones and other communication mediums.

The public sector is the portion of an economic system controlled by national, state or provincial and local governments. The public sector encompasses universal, critical services such as national defense, homeland security, police protection, firefighting, urban planning, corrections, taxation various social programs.

**History of ICT usage in public sector**

Over the last decades, governments all over the world have tried to take advantage of information and communication technology (ICT) to improve government operations and communications with citizens. Adoption of e-government has increased in most countries, but at the same time, the rate of successful adoption and operation varies from country to country. In present ,there exists general trends by examining interactions and mutual shaping processes between ICT evolution and several inter-related institutional changes including government operations, public services delivery, citizen participation, policy and decision making and government reform. The growing use of web 2.0, social media and mobile and wireless ICT by citizens can also heavily impact the way how public services are delivered and citizen engagement processes are carried out. For developing countries to successfully adopt ICT and try to leapfrog some of the obstacles encountered by early ICT adopters in developed counties, a systematic analysis needs to be conducted to understand the interactions among stakeholders ICTs and co-create the institutional environment to lead to a positive impact of ICT on public administration.

**ICT usage in world context**

The visions and goals for the use of ICTs in public sector are huge, both related to efficiency, effectiveness and for strengthening democratic functions. ICT policies include schemes that develop and enhance the national ICT infrastructure, the regulatory framework, and ICT adoption in society at large, that is "ICT literacy".
Asian Development Bank (ADB) projects and support to ICT have played an important role in public administration reforms in many countries. Such initiatives particularly benefit rural areas by connecting regional and local offices with central government ministries. These also allow national government agencies to communicate and interact with their local constituency and improve public services. There are various features of ICT related projects in the public sector. Those are Asia pacific public Electronic procurement Network, Design of e-governance Master plan and review of

Information and communication Technology capacity in Academic institutions, implementing the e-procurements system.

**New trends of ICT in public sector**

The present trend of usage of ICT in public sector is e- governance. E-government is defined as a set of public sector reforms that make use of ICT. E-government is the use of ICT to promote more efficient and cost effective government, to facilitate more convenient government services to a great extent. Public access to information makes government more transparent and accountable to citizens.

The e-enabled provision of public services to external customers has four main interaction links: government-to-citizen (G2C), government (G2G), and government-to-employee (G2E). Streamlining these interactions as a service provision, that is as a user oriented process, is at the heart of an e-government strategy. Corresponding technology capabilities within government, organizational capabilities and certain country-wide factors serve as enablers. Hence strategy and also focuses on the IT strategies of individual government entities, optimizing IT provision and operating models in people, process, technology, and governance.

**ICT usage in Sri Lankan context**

In such an environment, Sri Lanka's information and communications Technology (ICT) sector has grown in a remarkable fashion. According to the latest report titled "Sri Lankan IT/BPM industry 2014 review" by Sri Lankan Association of software and Service companies(SLASSCOM), IT sector's export revenue grew from US$ 2013 million in 2007 to an estimated US$ 720 million in 2013. The government has set a strategic goal for the sector which is to achieve US$ 1billion worth of IT exports by 2016. ICT authority bodies such as the ministry of Telecommunication and Information Technology, Information and Communication Technology agency of Sri Lanka (icta0 and SLASSCOM have worked tirelessly the last five years with other stakeholders in the industry to make this US$ 1billion target a realistic goal.

Global companies such as ATkearney, Gartner and IBM have already put Sri Lanka on the top of their global rankings and now the ICT sector is slowly progressing towards their next big goal, reaching US$5 billion in revenue by creating 200000 direct jobs and 1000 of Telecommunication and Information Technology, Information and Communication Technology agency of Srilanka (icta0 and SLASSCOM have worked tirelessly the last five years with other stakeholders in the industry to make this US$ 1billion target a realistic goal.

Global companies such as ATkearney, Gartner and IBM have already included Sri Lanka into the top of their global rankings and now the ICT sector is its slowing progression towards their next big goal, reaching US$5 billion in revenue , creating 200000 direct jobs and 1000 startups by 2022.

This article discusses about the history of ICT usage in public sector, new trends of ICT in public sector and the ICT usage in world and Sri Lankan context. Developed countries effectively use ICT in public sector to increase efficiency and serve to general public. Sri Lanka is a developing country. Sri Lanka still does not properly use ICT in public sector due to a number of limitations. Therefore to develop public sector, it is recommended that the Sri Lanka should improve ICT for government activities and services.

**B.P.G.D.P.Weerasingha**
3rd year
Department of public Administration







**ආර්ථික ස්ථායිතාව සඳහා සාගර සම්පත තුළින් ලැබෙන සුභදායක පිටුවහල**

වර්තමානය වන විට ජාත්‍යන්තර වෙළඳාම තුළ 95% කම ප්‍රමාණයක් සිදුවනුයේ සාගරය සමඟ ය. ජාත්‍යන්තර වෙළඳ සමීක්ෂණ වාර්තා පෙන්වා දෙන පරිදි ගුවන්යානා ආශ්‍රිතව සිදුවන වෙළඳාම ඉතා අල්ප ප්‍රමාණයකි. මේ අනුව සාර්ථක, තරඟකාරී වෙළඳ රටාවක් පවත්වා ගැනීමට නම් මහුදුබඩ වෙළඳාම් ක්‍රමය පැවතීම අනිවාර්ය වේ. ආනයන අපනයන දිරිගැන්වීම් මත ගෙවුම් ශේෂ අර්බුදයන් සඳහා විසඳුම් ලබාදීමට මෙහි දී හැකියාව උදා වේ.

ශ්‍රී ලංකාව තුළ පවත්නා ආර්ථික ප්‍රවණතාවන්හි වැදගත් සංධිස්ථානයක් සාගර සම්පත කෙරෙහි යොමු වේ. එයට ප්‍රධාන නිදසුනක් ලෙස සංචාරක කර්මාන්තය පෙන්වා දිය හැකිය. වාර්ෂිකව ශ්‍රී ලංකාවට පැමිණෙන විශාල සංචාරකයින් ප්‍රමාණයකගේ ප්‍රධාන අභිලාෂය ශ්‍රී ලංකාව මැදිකොටගත් ඉන්දියන් සාගරයේ පහස ලැබීමයි. වෙරළබඩ ආශ්‍රිත සංචාරක කර්මාන්තයේ දී රට අභ්‍යන්තරයේ නිෂ්පාදනය කරන නිෂ්පාදිත වලට පවා නිසි වටිනාකම් ලබා දීමට හැකි වීම මත දේශීය ආර්ථික මට්ටම වර්ධනය කරගත හැකිව තිබේ.

සාගර හා මත්ස්‍ය නිෂ්පාදනය ගැළපීමේදී දේශීය මත්ස්‍ය අවශ්‍යතාවයෙන් 90% ක්ම සපුරා ගැනීම සිදු වනුයේ සාගර මත්ස්‍ය වෙළඳාම තුළිනි.

මේ අනුව ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට සාගරය යනු ඉතා වටිනා සම්පතකි.

ගොඩබිම් ප්‍රමාණය හා සසඳන කල ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව ඉතා විශාල ප්‍රමාණයකි. මෙම අයිතිය ශ්‍රී ලංකාවට හිමි වූයේ 1983 "එක්සත් ජාතීන්ගේ සුමුද්‍ර නීතිය සම්බන්ධ සම්මුතිය" හරහාය. ඒ අනුව 1994 වර්ෂයේ දී එම සම්මුතිය සඳහා අත්සන් තැබීමෙන් අනතුරුව ගොඩබිම සිට නාවික සැතපුම් 200 ක හිමිකම කොටස් 03 ක් යටතේ ශ්‍රී ලංකාවට පවරන ලදී. මෙම සීමාව තුළදී මත්ස්‍ය සම්පත, අනෙකුත් විශේෂිත ස්වාභාවික සම්පත් ආදිය ලබා ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා රජය සතු වේ. නමුත් මෙය ශ්‍රී ලංකාවට පමණක් නොව ලෝකයේ ඕනෑම මුහුදක් හිමි රටකට අයිතිවාසිකම් කිව හැකි කරුණකි. කෙසේ නමුත් මෙම අයිතිය සඳහා සීමාවන් යම් යම් මුහුදුබඩ ආශ්‍රිත රටවල පැනවී තිබේ. එයට ප්‍රධාන හේතුව වනුයේ එම රටවල පිහිටීම අනුවයි. නමුත් වාසනාවකට අපගේ රටේ භූවිෂමතාව එසේ නොවේ.

සාගරය ආශ්‍රිතව මෙවැනි භූගෝලීය පිහිටීමක් ලැබීම මත ශ්‍රී ලංකා ආර්ථිකය වඩා ශක්තිමත් ලෙස නගා සිටුවිය හැකි බව ආර්ථික විද්‍යාඥයින්ගේ මතය වී තිබේ.

ඒ අනුව වඩා යහපත් හා තරඟකාරී ආර්ථික රටාවක් ගොඩනැංවීම සඳහා අනෙකුත් රටවල් වලට සාපේක්ෂව වඩා වාසිදායක ස්වභාවයක් ලෙස අපට හිමිව ඇති සාගර සම්පත යොදා ගැනීම ඉතා සාර්ථක ආර්ථික උපායමාර්ගයක් බව මේ අනුව මැනවින් පැහැදිලි වේ.

නදීෂා දෙනුක්ෂි ෆොන්සේකා
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (බාහිර)
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## සංවර්ධනය කරා

ඉතා ඉපැරණි ජන සමාජයේ සිට පැවත එන කුල භේදය තුළින් ප්‍රථම වරට දෙදරා ගිය ශ්‍රී ලාංකික ජන සමාජය වර්තමානය වන විට එපමණින් නොසෑහී ජාති භේදය, ආගම් භේදය, පක්ෂ භේදය යනාදී වූ විවිධාකාර මාතෘකාවන් මුල් කර ගනිමින් පොදුවේ ශ්‍රී ලාංකිකයින් යන අනන්‍යතාව අමතක කොට එකිනෙකා ඇන කොටා ගනිමින් ශ්‍රී ලංකාව සංවර්ධනයේ මාවතට ගැනීමේ ව්‍යාර්‍ථ උත්සහයක නියැළෙමින් සිටිති. නමුදු අප සිහියට ගතයුතු කරුණක් වනුයේ මෙවැනි නො මනා මතයන් මූලික කර ගනිමින් සංවර්ධනයක් කරා යාමට තබා සිතිමටවත් අපහසු කාර්යක් බවය.

යටත් විජිත පාලන සමයෙන් මිදී ස්වාධීන රාජ්‍යයක් වූ කාල සීමාවේ සිට වර්ෂ ගණනාවක් පසු කොට පැමිණිමුත් තවමත් ''ශ්‍රී ලංකාව යනු සංවර්ධනය වෙමින් පවතින රටකි'' යන තත්ත්වය වෙනස් කොට ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත් කිරීම අපි අසමත්ව සිටිමු. මේ දක්වා රටේ පාලන බලය ලබා ගත් විවිධ නායකයන් බොහොමයක් ස්වාධීන වැඩසටහන් හඳුන්වා දෙමින් කැපී පෙනෙන වෙනසක් ආර්ථික සමාජීය දේශපාලනික යනාදී වශයෙන් සිදු කර ඇතිමුත් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට අපොසත් විය රාජ්‍ය නායකයින්ට ප්‍රතිපත්ති සැකසීමට භාර දී, පරිපාලන අංශයෙහි නිලධාරීන්ට ඒවා නිසි ලෙස ක්‍රියාත්මත කිරීමය භාර දී රටේ සාමාන්‍ය මහජනතාව, ඔවුන් මෙම කාර්යයන් ඉටු කර සංවර්ධිත වූ රටක් අපගේ දෝතට ලබා දෙන තුරු බලා සිටිති. සැබවින් අප කළ යුත්තේ එපමණ ද ?

සංවර්ධිත ශ්‍රී ලංකාවක් යනු අප සියල්ලන්ගේ ම සිහිනයකි. එනිසා එය සපුරාලීමේ වගකීම අප මත ද පැවරී තිබේ. ශ්‍රී ලංකාවේ තරම් ම ප්‍රමාණවත් භෞතික සම්පත් නොව සිංහප්පූරුව ඒ අයුරින් අප පසු කරමින් සංවර්ධිත මාවතෙහි විශාල වෙනසක් කරා ගොස් ඇත්තේ නම් අපට ද නිසැකවම එය ළඟා කර ගත හැකි වනු ඇත. එම ගමනට බාධා පමුණුවන පටු ආර්ථමාර්තකාමී අදහස් පසෙකලා සියල්ලන්ම එකමුතුව කටයුතු කළ යුතු කාලය එළඹී ඇත. තව දුරටත් තව කෙනෙකුගේ අපගේ මෙම සිහිනය නොරඳවා එකමුතු බැවින්, කැපවීමෙන් යුතුව රටේ සංවර්ධන ගමනට පාර සකසනු. එවිට සෑම දෙනාටම එක සේ ප්‍රතිලාබ ලැබෙන සුන්දර අනාගතයක් නිමැවෙන ''සංවර්ධිත ශ්‍රී ලංකාව'' වැඩි ඈතක නොවනු ඇත.

එල්.ඩී. රංසි මධුභාෂිණි කරුණාරත්න
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
තෙවන වසර

### මුලාව

කපටි සිනාවෙන් මුව සරසාගෙන
ජාතික ඇඳුමෙන් විලිය වසාගෙන
නමින් සත් ගුණවත්
ක්‍රියාවෙන් නොමිනිස්
ඇමති තෙමේ
වේදිකාවට නැග
දොඩයි මුබරි වදන්
තම පක්ෂෙ ගැන පාරම්බාන
විරුද්ධ පක්ෂෙට දෙස් දෙවොල් තබන
අපූරු ඇමති පට්ටම
කී දේකුත් නැත
කළ දේකුත් නැත
එහෙත්
දස දෙසින් ඇසෙයි හුරේ හඬ
දෙඬුම අහවරය
ආරක්ෂකයින් පිරිවරාගෙන
ගොඩවැදුනි හයිබ්‍රිඩ් රථයට
ගියා අස්ප වේගෙන්
පළාතම දූවිල්ලෙන් අඳුරු කර

උදේශිකා ඉසුරුණි ආරියරත්න
2011/12 අධ්‍යයන වර්ෂය
ඉතිහාස අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය





## "ලංකාවේ නිවෙස් ඉදිරිපිට බැඳි සල්ලි මිටි"

කොළඹ කන්දක් තිබෙනවාදැයි ඇසුවොත් අපි අසන්නනේ කොළඹ මොන කඳු ද? කියා ය. එහෙත් කොළඹ වටේ රවුමක් ගියහොත් මීතොටමුල්ලේදී අපට හමුවන්නේ කොළඹ පිහිටා තිබෙන පාෂාණ වලින් සෑදුණු කන්දක් නම් නොවේ. කුණු වලින් හැදුණු කන්දයි. කොළඹ ඕනෑම පාරක නිවෙස් ඉදිරිපිට අපි දකින මලු අන් එකක් නොවේ. කුණු මලුය. අපි අවඥාවෙන් කුණු යැයි බැහැර කරනු ලබන මෙම අපද්‍රව්‍ය අප හට අපද්‍රව්‍යක් වුව ද ලෝකයේ අනෙක් රටවල් වලට නම් මහඟු සම්පතකි. ඒ නිසා මෙම කුණු මලු සල්ලි මිටි යැයි කීවාට වරදක් නැත. අවාසනාවකට කුණු කසල සම්පතක් ලෙස හඳුනා ගන්නට තරම් අපේ ජාතිය සාක්ෂරතාවයක් ලබා නොමැති බව කනගාටුවෙන් වුව ද පැවසිය යුතු ම කරුණකි.

මහාචාර්ය ඩැනී අතපත්තු විසින් රචිත "සංගෘහිත ආර්ථික විද්‍යා ප්‍රවේශය" හි මෙවැනි සටහනක් ඇත. "ශ්‍රී ලංකාවේ පළාත් පාලන නීති සංග්‍රහයන් අනුව කසළ දේපළක් ලෙස නිර්වචනය කර තිබේ. දේපළ හෝ සම්පත් ලෙසින් හැඳින්වෙන ද්‍රව්‍ය අර්ථ ශාස්ත්‍රය න්‍යාය ධර්මතා අනුව මිනිස් වුවමනා තෘප්තිමත් කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ද්‍රව්‍ය වන්නේ ය."

එයට කදිම නිදසුනක් ලෙස පසුගිය දා ජන සන්නිවේදන මාධ්‍ය ඔස්සේ කුණු කසලින් ගඩොල් නිපදවන පුද්ගලයෙකු පිළිබඳ අපට අසන්නට ලැබුණේ මෙවදන් සිහි ගන්වමිනි.

මීට වසර 12කට පෙර ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන මඟින් එකතු කරන ලද අපද්‍රව්‍ය පිළිබඳ දත්ත සංචිතය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 330 ක් මීට වසර 12 පෙර දිනකට අපද්‍රව්‍ය ටොන් 2025 ක් එකතු කරන බව පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යංශ දත්ත වාර්තා ප්‍රකාශ කරයි. වසර 12 කට පෙර තත්වය එබඳු නම් අද තත්වය ගැන සිතන්නට දෙයක් තිබේ ද?

කසළ කුණු ජරාව ලෙස අප බැහැර කරන දේ ආර්ථික විද්‍යාව තුළ සුවිසල් ආර්ථික ප්‍රභවයක් ලෙස නිර්වචනය කරයි. නමුත් ගැටලුව වී ඇත්තේ මෙම සුවිසල් ආර්ථික ප්‍රභවය ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරමින් පොදු මහජනයාට වඩාත් උපයෝගීතාවයක් ඇති වන පරිදි වැඩ පිළිවෙළක් ප්‍රායෝගිකව ක්‍රියාක්මක කරන නායකත්වයක් නොමැති වීමයි. සැලකිය යුතු රාජ්‍ය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු මේවා පිළිබඳ දැනුවත් නම් අද වන විට කොළඹට කුණු කන්දක සේයාවක්වත් නොපෙන්නට තිබුණි. ඒ නිසා ම අද වන විට කසළ කළමනාකරණය අපට අභියෝගයක් වී හමාරය.

නිවාස ඉදිරිපිට කුණු ගොඩ ගසා "මුස්පේන්තු" සමාජයක් බිහි කිරීමේ ක්‍රමෝපායක් අත් හිටුවීම ප්‍රධාන වශයෙන් කළ යුත්තකි. කසළ කළමණාකරණයේදී ලංකාවේ මේ සමාජ විද්‍යාත්මක මූලධර්ම නොසලකා හැරීමේ අනිටු ප්‍රතිවිපාක වලට අද අපිට ජාතියක් වශයෙන් මුහුණ දීමට සිදුවී ඇත. ශ්‍රී ලංකාවේ මීගොඩ, බියගම, හොරණ ප්‍රදේශවල ගොඩනැගීමට ගිය සනීපාරක්ෂක කසළ බිම් පිරවුම් වලට එරෙහි ව ජනතාව හඬ නැගුවේ "කොළඹ කුණු අපිට එපා" යැයි කියමිනි. එහෙත් ගමේ කුණු ටික දාන්නට තැනක් නැති ව ගමේ නගර සභාවේ කුණු ලොරිය ගම වටේ යන බවට අපේ රටේ ජනතාව නොදන්නවා නොවේ. පැහැදිලිව ම අපේ රටේ කුණු ප්‍රශ්නයට හේතුව එළිමහනට කසළ බැහැර කිරීමේ :ධචැබ ฯමපචසබට* ක්‍රමවේදය වේ.

කසළ ගැටලුව සැලකීමේදී කසළ ලැබෙන මූලාශ්‍ර 7 ක් හඳුනාගත හැකිය. නිවාස, රෝහල්, පාසල්, ආපනශාලා, කර්මාන්තශාලා, අවමංගල ශාලා මෙන්ම ව්‍යාපාරික ස්ථාන වේ. මහජනයාගේ අක්‍රමවත් නූගත් කසළ බැහැර කිරීම් නිසා විපාක අත්විඳින්නේ ඔවුන් ම ය. වායු දූෂණය, ජල දූෂණය, පස දූෂණය මෙහි අනිටු ප්‍රතිවිපාක වේ. බරපතල ලෙස සෞඛ්‍ය ගැටලු ඇති කරමින් ජෛව විවිධත්වය කාබාසිනියා කරමින්, පරිසර අලංකරණය වනසමින් මුළු සමාජයම ගඳ ගැස්වීම කුණු ප්‍රශ්නයේ අවසන් ප්‍රතිඵලය වී හමාර ය.

පැහැදිලිව ම මේ සල්ලි මිටි තුළ ඇති දේ 98% ක්ම ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඒවාය. ඉඳුල්, යකඩ, ලෝහ, කඩදාසි, වීදුරු, පොලිතීන් ආදී සියල්ල ප්‍රතිචක්‍රීකරණය කල හැකිය. නොහැක්කේ අයිතම 2 කි. එනම් ටෙට්‍රා පැක් (ඔැඑර් ඡ්ජන) නම් මයිලෝ වැනි බීම පැකට් සහ රිජිෆෝම් (ඍසටසදේප) වේ. අනෙකුත් සියල්ල මුදල් බවට පත් කළ හැකිය. එහෙත් මේවා ප්‍රභේද නොකොට පොට්ටනි බැඳ කොහේ හෝ පාළු තැනකට හෝ වගුරු බිමකට ඇද බෑම අපේ ජාතික ප්‍රතිපත්තිය බව අකමැත්තෙන් වුව ද කිව යුතු ය.

එහෙත් එදා අපිට මෙවන් තත්වයක් නොතිබුණි. එදා සමාජය මෙතරම් "කුණු" වී තිබුනේ නැත. එදා ලිප් බොක්කේ අළු දැම්මේ කෙසෙල් ගස් මුලට ය. කොස් කටු ටික කෑවේ ගෙදර ඇති කල එළ වැස්සියන්ය, කොළ රොඩු ටික දැම්මේ ගසක් මුලටය, යන්තම් හෝ ඉතිරිවූයේ පොලිතීන් බෑග් දවටන කිහිපයක් පමණි. ඒවා සකසුරුවම් කිරීමට එදා අපේ අත්තම්මලා මනාව දැන සිටිය හ. පර්චස් 5 ක හෝ 3 ක භූමියක් වටේට තාප්ප බැද ඉඩම් පුරා ගෙවල් හැදූ වතුර ටික උරා ගන්නට වත් නැතිව මහ පොළවට ඉන්ටර්ලොක් ගල් ඇල්ලූ අපේ කාලේ ජීවින කලාව ගැන කවර කතා ද?

කසළ කළමණාකරණයේදී උපරිම ලෙස ස්වභාවික ක්‍රම භාවිතය තුළින් පරිහානිය අවම කර ගත හැකි ය. ලෝකයේ ජීවත්වීමට සුදුසු නගර අතරට බදුල්ල එක්වූයේ මේ ස්වභාවික කසළ කළමණාකරණය නිසා ය. කුණු ප්‍රශ්නයේදී නගර සභාවට හෝ ප්‍රාදේශීය සභාව වෙත වගකීම භාරදී අත පිසදා ගැනීම කාගේත් පුරුද්ද ය. එහෙත් නගර සභාවේ කුණු ලොරිය නොපැමිණි දාට නගරාධිපතිව ඡන්ද නොදී ගෙදර යවන බවට දත් මිටි නොකා වගකීමක් ඇති පුරවැසියෙකු ලෙස කටයුතු කිරීම ජාතික අවශ්‍යතාවයකි.

සෙව්වන්දි ලක්ෂිකා රත්නායක,
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යනාංශය
තුන්වන වසර

# වර්තමාන ශ්‍රී ලංකාවේ කාර්මීකරණයේ අඳුරු පැතිකඩ

ලෝක ආර්ථික, දේශපාලන හා සමාජ සංස්කෘතික පසුබිම අනුව ශ්‍රී ලංකාව යනු තුන්වන ලොකයේ රටකි. කෙසේ නමුත් අපේ රට සීඝ්‍රයෙන් කාර්මීකරණයට ලක් වන රටකි. එනම් නව කර්මාන්ත පද්ධතීන් බිහි වෙමින් දියුණු ආර්ථික තලයකට ගමන් කිරීමට උත්සාහ දරණ පසුගාමී ආර්ථිකයක් හිමි රටකි. මේ ඔස්සේ බොහෝ කර්මාන්ත සඳහා ඉඩ ප්‍රස්ථා හා ආයෝජන අවස්ථා  බිහිවෙමින් පවතින අතර දේශීය ආයෝජකයන් මෙන්ම විදේශීය ආයෝජකයන් ද ශ්‍රී ලංකාව තුළ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කාර්මික අංශයන්ට යොමු වෙමින් පවතී. මෙහි දී ආර්ථික වාසි හිමි වනවාක් මෙන්ම පාරිසරික තිරසාර පැවැත්මට දැඩි බලපෑම් එල්ල වෙමින් පවතී. එහි එක් පැතිකඩක් වන විෂ රසායනඉක ද්‍රව්‍ය භාවිතය මඟින් රට තුළ පාරිසරික හා ජෛව විද්‍යාත්මක පද්ධතීන්ට වන බලපෑම අඩු තක්සේරුවට ලක් කර ඇති බවත් මෑත කාලීනව මේ හා සම්බන්ධව පැන නැගුණ ගැටලුකාරී තත්වයන් අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. උදාහරණයක් ලෙස රතුපස්වල සිදුවීම ගත හැක.

මෙම සිදුවීම සම්බන්ධ කරුණු සැලකීමේ දී ශ්‍රී ලංකාව තුළ නම ගිය සමූහ ව්‍යාපාරයක් සම්බන්ධ වේ. මෙහි අනු සමාගමක් විසින් පවත්වා ගෙන ගිය රබර් අත් පළඳනා නිෂ්පාදනාගාරයකින් ඉවතලන විෂ රසායන ද්‍රව්‍ය අවිධිමත් ආකාරයෙන් පරිසරයට මුදා හැරීම හේතුවෙන් ප්‍රදේශයේ ස්වාභාවික ජල ප්‍රවාහයන් භාවිතයට නුසුදුසු වන ලෙස දූෂණයට ලක් විය. එහිදී ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලැබෙන මූලාශ්‍රයක් වන ළිං ජලය පානය කිරීම කෙසේ වෙතත් අනෙකුත් පිරිසිදු කටයුතු කිරීමට පවා නොහැකි වන අන්දමින් අපවිත්‍ර විය. මේ හේතුවෙන් ප්‍රදේශවාසීන් දැඩි අරගලයක නිරත වූවත්, කීමට කණගාටුදායක කරුණ නම් මෙවැනි හදිසි තත්ත්වයක දී දේශපාලනඥයින් තමන්ට පැවරී ඇති වගකීම පැහැර හැරීමයි. රජයක් විසින් සිදු කළ යුත්තේ ජනතාවට පහර දීම නොව ජනතාවගේ හඬට කන්දීමයි. අනෙක් අතට ජනතාව අතර සිටින අනෙකුත් දේශපාලන කණ්ඩායම් සිදු කරනුයේ අහිංසක ජනතාව වියරුවට පත් කර රජයට විරුද්ධව කැරලි ඇති කිරීමය. ව්‍යාපාරිකයන් තමන් සතු ධනය බලය යොදා ගනිමින් ජනතාවට ඇති එකම පිළිසරණ වන නීතියේ විය සිදුරු තුළින් පැනගොස් තම ව්‍යාපාරයන් පවත්වාගෙන යාමයි.

ව්‍යාපාරිකයන් යනු රටක ආර්ථිකමය පැතිකඩකින් කතා කරන විට ඉතා වැදගත් ඒකකයකි. මන්ද රටක ප්‍රධාන ආර්ථික කාරකයක් වන බැවිනි. රටක් කෙටි කාලීන හා දිගු කාලීන වශයෙන් සැලකිය යුතු සංවර්ධන මාවතකට ලඟා වීමට ඔවුන්ගෙන් විශාල දායකත්වයක් හිමිවේ. නමුත් ගැටලුව වනුයේ ඔවුන් තමන්ගෙන් ඉටුවිය යුතු සමාජ වගකීම පැහරහැරීමයි. එනම් තමන්ගේ කොටස වැඩිකර ගැනීමට පමණක් කටයුතු කිරීමෙන් අනෙකුත් ස්වාභාවික, සමාජ හා සංස්කෘතික පද්ධතීන්ට වන සෘණාත්මක බලපෑම නොසලකා හැරීමයි. අනෙක් අතට ශ්‍රී ලංකාව තුළ පවතින මේ හා සම්බන්ධ නියාමන ආයතනයන් තම වගකීම හා රාජකාරීන් නිසි පරිදි ඉටු නොකිරීම හේතුවෙන් මෙවැනි ගටලුකාරී තත්ත්වයන් උත්සන්නව ඇත. තවත් කරුණක් නම් මේ හා සම්බන්ධව පැහැදිලි රාජ්‍ය ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සම්පාදනය නොවීම නිසා තවදුරටත් ගැටලුකාරී තත්ත්වයන් විවිධ වූ කර්මාන්ත ඔස්සේ පැන නැගිය හැක.

මෙම විෂ රසායන ද්‍රව්‍ය බැහැර කිරීම හා කළමණාකරණය සම්බන්ධව ගවේෂණයක දී සොයාගත් සඟවුනු අංශයක් අංශයක් පිළිනඳව කරුණු අනාවරණය වී ඇත. එනම් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින ව්‍යවහාරික විද්‍යා පීඨ, වෛද්‍ය පීඨ, කාර්මික හා ඉංජිනේරු පීඨ තුළ අධ්‍යන විද්‍යාගාර පරීක්ෂණ තුළින් ඉවතලන අධික විෂ රසායන ද්‍රව්‍ය කළමනාකරණය හා බැහැර කිරීම සම්බන්ධව පවතින අර්බුධකාරී තත්ත්වයන් වේ. එහිදී සඳහන් කළ හැක්කේ බොහෝ විද්‍යාගාර පරීක්ෂණ තුළින් ඉවතලන විෂ රසායන ද්‍රව්‍ය අවිධිමත් ආකාරයෙන් පරිසරයට මුදාහරින බවයි. එනම් භූගත ටැංකි තුළින් පසට එකතු වීමට සැලැස්වීම, ආශ්‍රිත වැව්, පොකුණු ආදී ජල මූලාශ්‍ර මඟින් පරිසරයට එකතු වීමට ඉඩ සැලසීම වැනි ක්‍රියා මාර්ගයන්ය. මෙවැනි තාවකාලික විසඳුම් මඟින් අනාගතයේ දී පරිසර පද්ධතියට වන බලපෑම මෙතෙකැයි තක්සෙරු කළ නොහැක. එනම් මෙවැනි විෂ රසායන ද්‍රව්‍ය පරිසරයට ඍජුවම හෝ වක්‍රාකාරයෙන් පානීය ජලය හා අප ස්වාභාවිකපරිසරයෙන් අප ලබා ගන්නා අහාර ඔස්සේ එම විෂ සංඝටක  ශරීරගත  වෙයි. තවද ජෛව විද්‍යාත්මක වශයෙන් වටිනාකමක් ඇති සත්ත්ව විශේෂ විනාශ වී යාමත් නිසා සමස්ත ස්වාභාවික හා ජෛව ගෝලීය පරිසර පද්ධතියේ සමස්ථිතිය බිඳීයාම සිදුවී පෘථිවි ගෝලයේ ජීවය විනාශ වී යයි. මෙහි දැනට මනුශ්‍ය වර්ගයාගේ සහ  අනෙකුත් සත්ත්වයින් ගේ ආයු අපේක්ෂාව ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. මෙයට බලපාන ප්‍රධාන කරුණක් නම් විවිධ පිළිකා ආශ්‍රිත රෝග වර්ධනය වීමය.

සංවර්ධිත රටවල් කාර්මික විප්ලවය මඟින් මේ හා සම්බන්ධව බොහෝ පාඩම් ඉගෙනගෙන ඇත. නමුත් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල මෙවැනි ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳව පවතිනුයේ අඩු අවධානයකි. අනෙක් අතට සංවර්ධිත රටවල් මෙම විෂ රසායන ද්‍රව්‍ය  තම රටේ ගොඩගසා ගැනීම වෙනුවට ඌන සංවර්ධිත දිළිඳු රටවල් වලට විවිධ නිෂ්පාදන ඔස්සේ අපනයනය කරනු ලබයි. එමඟින් ඔවුනට ආදායමක් මෙන්ම තම රටේ ගොඩගැසෙන කුණු හා වෙනත් රසායන අපද්‍රව්‍ය තම රටින් ඉවතට දැමිය හැක. උදාහරණයක් වශයෙන් පසුගිය කාල වකවානුව තුළ ආනයනිත පොහොර සම්බන්ධව ගැටලු පැනනැගුණි. එනම් විදෙශ රටවල් අඩු මිලට රසායන ද්‍රව්‍ය සහ පොහොර ලබා දීමත් එම පොහොර හා රසායන ද්‍රව්‍ය අප රටේ කෘෂිකාර්මික කටයුතු වලට යොදා ගැනීමත්  නිසා ඒවායේ අඩංගුව තිනූ බැර ලෝහ විශේෂයන් ජල මූලාශ්‍ර ඔස්සේ පරිසරයට එකතුවන ලදි. කෘෂිකාර්මික කටයුතුවල නිරතවන ප්‍රදේශ වල පුද්ගලයන්ට වකුගඩු ආශ්‍රිත රෝගාබාධ වැළඳීමට මෙය ප්‍රධාන හේතුවක් විය.

මෙවැනි විවිධාකාර ගැටලු වලට ශ්‍රී ලංකාව දැනටමත් මුහුණ දී හමාරය. නමුත් උගත් පාඩම් හා තිරසාරාත්මක පැතිකඩයන් ඔස්සේ තීන්දු තීරණ ගැනීමට යොමු වී ඇති බවක් තවමත් පෙනෙන්නට නොමැත. තිරසර සංවර්ධනයක් තුළින් කාර්මීකරණ ක්‍රියාවලීන් සුමටව ගලා යාමට නම් මෙම ගැටලු සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කිරීම පාලකයන්ගේ පමණක් නොව අප සැමගේ වගකීමකි.

එච්.ඩබ්.ඩී.එස්. ගුණතිලක
රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයන අංශය
තෙවන වසර

# LIFE

Life is a glass
beautify with grass
wearing masks
we all are dance.....
take a chance
we win by chance....
When the boys
are in a mess
just relax
and play chess
Then
he'll value his lass....
If you collect mass
valuing finance
at a glance
you are ants
but not mans....
Make others pleasant
at your expense
it may be a bless
that follows us.....

**W. Nadeeshani sellahewa**
3rd year
Department of Public Administration

## දස මාසේ

හිරුටත් උදෙන් අවදි වී
සඳුටත් පසුව නෙත නිදි ලබනා
දහසක් හීන මල් හදේ පොදි බැඳන්
මුළු ලොවම නලවන්නී
මගේ අම්මාය

සඳේ සිසිලගෙන ලොවම සනසන
හිරුගෙ රැස් ගෙන ලොවම පුබුදන
හිතේ සවිය ගෙන
ලොවම නගවන
ජන්මයෙන් ජන්මයට
ආත්මගත තිඹිරිගෙයයි නුඹ

හිරුගෙ එළියත් සඳුගෙ සිසිලත්
හිතේ සවියත් එකට කැටි කොට
නව ලොවක් නගා ...
දුරින් හිඳ එහි සිරි විඳ
තුටු කඳුලින් සැනසෙන්නම්
තවත් කුමට නව අභිසෙස්
කුමට තව පැසසුම්
නුඹයි මගේ මුළු ලොවටම අම්මා....

නදුන් අසංක
රාජ්‍ය පරිපාලන  විද්‍යා අධ්‍යයනාංශය
දෙවන වසර

CLASSIC 2K17 | Feel the Art of Public Administration

# කාන්තා විමුක්තිය

'' අහල්‍යා ද්‍රෞපදී මන්දෝදරී තථා පඤ්චකන්‍ය ස්මාරේන්නිත්‍යං මහාපාතකනාශනම් අහල්‍ය, ද්‍රෞපදී, කුණි, තාරා සහ මන්දෝදරී යන පඤ්චකන්‍යා නාම නිබ සිහි කිරීමෙන් මහා පව් නැසෙයි.''

මේ සංස්කෘත සාහිත්‍යය ස්ත්‍රියට හිමි කර දෙන ස්ථානයයි. ''විමුක්ති'' යන වචනය පවා භාෂාත්මක වශයෙන් අයත් වන්නේ ස්ත්‍රී ලිංගයටයි. විශේෂයෙන් යන අර්ථ දෙන ''වි'' උපසර්ගය මුලින් යෙදී මිදීම යන අරුතෙහි යෙදෙන ''මුච්'' ධාතුවෙන් සෑදෙන ''විමුක්ති'' සම්බන්ධයෙන් ස්ත්‍රී සහ පුරුෂ යන දෙපක්ෂය ම නිසා ය. ලෝකය ලක්සන වන්නේ ස්ත්‍රී සහ පුරුෂ යන දෙපක්ෂයම නිසාය. ලෝකය පවතින්නේ ද මේ පිරිස ම නිසා ය. එහෙයින් පුරුෂයන් හෙළා දකින කාන්තා විමුක්තියක් ගැන හෝ ස්ත්‍රීන් හෙළා දකින පුරුෂ විමුක්තියක් ගැන හෝ කතා කිරීම නිෂ්ඵල ය. සුප්‍රකට භාරතීය ලේඛිකාවක වන "කමලා දාස්" වරෙක මෙසේ ප්‍රකාශ කළා ය.

'' පිරිමියාට ගරහන කාන්තා විමුක්තිකයන් මම පිළිගන්නේ නැහැ'' ගෙදර කියන්නේ ගැහැණිය පමණක් නොවෙයි. සැමියා නැත්නම් මට නම් ඒක ගෙදරක් නෙමෙයි. මගේ හිතේ දුකක් ඇති වුණා ම ඔහුගේ දණහිසේ ඔලුව තියාගෙන අඬන්න දුක කියන්න මට සැමියා ඕන. ඔහු නැතුව මට බැහැ''

විමුක්තිය ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම අවශ්‍ය ය. ලොව පහළ වූ උතුම් ශාස්තෘන් වහන්සේලා ගැඹුරින් ම මේ සත්‍යය අවබෝධ කොට ගෙන සිටිසේක. සැබෑ පිරිමින් සිටින සමාජයක නම් ස්ත්‍රී හිංසනයක් සිදු විය හැකි නොවේ. ලෝකයේ සියලු ම ස්ත්‍රී පුරුෂයනට උපත ලබා දෙන්නේ ගැහැනිය යි. එය පුරුෂයාට කළ නොහැකි කාර්යයකි. දරුවන් ජීවත් කරවීමෙහි ලා කිරි එරෙන්නේ ද ගැහැණියට යි. මෙබඳු වූ ගැහැනිය, වරෙක අපේ අම්මා ලෙස, බිරිඳ ලෙස, සොයුරිය ලෙස, දියණිය ලෙස හෝ අපේ මිතුරිය ලෙස අපේ ජීවිතයට සමීප වෙයි.

ස්ත්‍රී පුරුෂ දෙපිරිස අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධයකි. සංස්කෘත භාෂාවේ ලිංග භේදය සකස්වීමේ දී පවා ඒ පිළිබඳ සතිමත් වූ බවක් පෙනේ. සංස්කෘතය ස්ත්‍රී පුරුෂ ස්වභාව දකින්නේ ඍජු වශයෙන් ස්ත්‍රී හෝ පුරුෂ ගණයට අයත් කළ හැකි චරිතවල පමණක් නොවේ. සොබාදහමේ විද්‍යාමාන වස්තූන්වල පවා ඔවුහු ස්ත්‍රී පුරුෂ ස්වභාවය දුටුහ. ඒ අනුව වෘක්ෂ යනු පුරුෂ ලිංග පදයකි. ඒ වෘක්ෂ වටා එතෙන "ලතා" ස්ත්‍රී ලිංග වේ. සමුද්‍ර පුරුෂ ලිංගයයි සමුදුර පෝෂණය කරමින් ඔහු වෙත ගලා යන නදී ස්ත්‍රී ලිංගයි.

ස්ත්‍රී රූපයෙන් හෝ පුරුෂ රූපයෙහි හෝ සුන්දරත්වය දකීමෙහි වරදක් නැත. වරද ඇත්තේ සුන්දර දෙය අසුන්දර කරන තැනයි. පසුගිය කාලය තුළ කලාවේ නාමයෙන් නිෂ්පාදිත චිත්‍රපට රැගත් සීඩී ඩී.වී.ඩී තැටි රැසක් අධ්‍යයනය කළෙමි. ඛේදවාදකය වන්නේ ඒවායින් බොහොමයක් නිෂ්පාදනය කළ අය ස්ත්‍රී - පුරෂ සම්බන්ධයේ සුන්දර අර්ථය නො දැන තිබීමයි. ස්ත්‍රී පුරුෂ රූපයට ඔවුනොවුන් පෙම් බැඳීම සැබෑ ලෞකික සමාජයක නම් අපරාධයක් විය හැකි නොවේ. අපරාධ යනු වැරදි ලෙස සතුටු වීමයි. කලාකරුවන්, නිර්මාණ කරුවන්, විසින් කළ යුත්තේ ජීවිතයට පෙම් බැඳීමේ පාඩම ලෝකයාට කියා දීමයි. එහෙත් කලාවේ නාමයෙන් නිෂ්පාදිත මේ බොහොමයක ඇත්තේ ස්තී හෝ පුරුෂ ශරීර විනාශ කරන කරවන දර්ශන මිස ඒවාට ආදරය කරන කරවන දර්ශන නොවේ. වරෙක සෞන්දර්යය ගැන කතා කරමින් රබීන්ද්‍රනාත් තාගෝර් නම් සාහිත්‍යධරයා මෙසේ පැවසී ය.

'' මිනිසා බාහිර ලෝකය හා සොබාදහම සමඟ ඒකාබද්ධ කිරීමේ අභිලාෂය තුළින් සෞන්දර්ය හට ගෙන තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු සිය ආත්මභාවය පුළුල් කාට ගෙන තමා ගැන මනා අවබෝධයක් ලබා ගනියි. මේ ක්‍රියාව නම් සොබාදහමේ නීතියක් වශයෙන් ගත හැකි ප්‍රේමයයි. අපේ ජීවිතයට අයත් කාර්යය නම් අප තුළ විකසිත වන මේ ප්‍රේමය ලොව අනෙක් අයගේ ජීවත හා සම්බන්ධ කිරීමයි.''

සිය කායික මරණය තෙක් අන්‍යයන්ගේ ජීවිත සමඟ සැබෑ ප්‍රේමය සම්බන්ධ කළ සමන් කලාකරුවා ස්ත්‍රීය නො තකන සමාජය කොයිතරම් බාහිර වශයෙන් දියුණු වී තිබුණත් එය නොදියුණු සමාජයක් ලෙස අර්ථකථනය කළේය. එසේ ම ගැහැනිය තමන් වැදූ මිනිස් පරපුර රැක ගැන්මේ උදාර කර්තව්‍යයෙහි නිබඳ නිරත විය යුතු ය. යන්න ද හේ අවධාරණය කළේය. ගැහැනිය නිවැරදි දෙය උදෙසා සිය කටහඬ අවදි කරවන තැන ඔහු කාන්තා විමුක්තිය දුටුවේ ය. ඔහුගේ පහත සඳහන් ප්‍රකාශය සාවධාන වන මෙන් අයැදිමින් කාන්තා විමුක්තිය ගැන ලියැවෙන මෙම සටහන නිමා කරනු කැමැත්තෙමි

'' ලෝකය මුළුමනින් ම යහපත් දේශයක් කරගැනීමේ කර්තව්‍යය මේ තාක් මුළුමනින් ම සිදු නො වූවේ මන් ද? ඒ සඳහා ශ්‍රේෂ්ඨ මිනිසුන් විඳි වදවේදනා අපමණ ය.

ලෝකය මුළුමනින්ම යහපත් නොවීමට හේතුව ස්ත්‍රීය තමන් වැදූ මිනිස් පරපුර රැකගැන්මේ උදාර කර්තව්‍යවයෙන් ඈත් ව සිටීම ය.

අසත්‍යය පරාජය කිරීම සඳහා ස්ත්‍රීයගේ කටහඬ අවදි නොවීම ය.

මෙයට ඇති පිළියම නම් ස්ත්‍රී ආත්මය ස්වකීය කටහඬ අවදි කිරීමයි.

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ
සංස්කෘත පිළිබඳ මහාචාර්ය
භාෂා, සංස්කෘතික අධ්‍යයන හා
ප්‍රාසාංගික කලා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය





## පුදුමෙකුත් නෑ ඒක

Traffic හංදිය ළඟ
බහින අය නැගිටින්න
කොන්දාගේ සද්දෙටම
උඩ ගිහින් ඇහැරුණා .....

දඩිබිඩියේ බැහැගත්තා
ඥාන පොත් කඩේ ළඟ
ගොඩවුණා හනිකට
ත්‍රී රෝද රියකට ...........

යං මල්ලි බරණැසේ
හෝටලේ ගාවට
කස පාර්ක් එක ගාව
හරවපන් පොඩ්ඩකට
කෙල්ල ඇති bend එකේ
ඒකිවත් දාන් යං ...........

කෝ අනේ නෑ මෙයා
නැවතියන් පොඩ්ඩකට
හලෝ සුදූ කෝ ඔයා
තාම ඇවිදින් නැනේ ....


අනේ සුදූ තාම මං
සෝරතේ Flat එකේ
ඉන්න එහෙනම් ඔහොම
මම ඇවිත් ගන්නකම්
මල්ලි ඔහොමම යමන්
Hospital පාරෙන්

මොකද බන් මෙතරම්
Traffic අද මේ හරියේ
ඇයි අයියේ දන්නැද්ද
Rock Ground show එක
ආ මල්ලි එහෙමද
ඔහොම අයිනට ගනිං...
ඉක්මනට එන්න සුදූ
පහත් පහුවෙලා දැන් .....

අනේ එහෙනම් මෙහෙම
හවස් වුණු එකේ දැන්
විවෘතාරාමෙත්
වැදගෙනම අපි යං

ගැස්සිලා ඇහැරෙන්නේ
දහඩියත් දාගෙන
මහ දවල් මං දැක්කේ
පුදුම කළු හීනයක්
හැබැයි යන තාලෙට
පුදුමෙකත් නෑ ඒකේ

එස්. ඒ. උදාරි චම්පිකා
මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය
තෙවන වසර



## ඔබම පතනා කන්නගී මම ......

කුමන වරදක් කළත් ඔබ මට
මතක පමණක් හිතේ ගුලි කර
සසරේ හැමදා ඔබට හිමිවුණ
ඔබම පතනා කන්නගී මම .....

එක් නිමේෂෙක දුනුණු පහසට
ලෝභ බැඳ පෙම් ලොවම සුන්කර
රාග ගින්නෙන් දැවී වෙන්වුණ
මාධවීගේ කොවලන් නුඹ .....

නොදැන ඔබ ගැන බැඳී රූපෙට
ඇයට වැඩියෙන් ඔබට පෙම්කර
ජීවිතේ මඟ අතරමං වුන
කෝවලන් ඔබේ මාධවී ඇය .....

මාධවීගේ උතුම් ප්‍රේමෙට
තවත් සුන්දර නමක් එක්කර
ඔබේ අයිතිය ලෙසට බිහිවුණු
මණි මේඛලාමයි ඔබේ සුදු දුව ....

ජී.ආර්.ජේ අනුරාජිකා නයනානන්ද
රාජ්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය
ප්‍රථම වසර

# Brain Drain in Sri Lanka




**Introduction**

Brain Drain has been one of the frequent phenomena in the recent past in Sri Lanka which has its roots hindering the development of the country. In this article, is it expected to explore the concept of Brain Drain, the driving factors, causes and the depth of Brain Drain as factor which hinders development. Later in the article the attempts taken by the government to control brain drain is discussed.

**What is Brain Drain?**

Brain Drain is simply the migration of highly skilled professional to foreign countries in search of better opportunities. In other words in could be termed as the "Human Capital Flight". Scientists, Engineers, Chartered Accountants, Doctors, etc. are knowledge workers in different sectors who rely on their professional judgement and the capacity generated through the continuous training and skill building through experience. These professionals represents the human capital of a country anchoring the development of a country. When these workers move out of the country, it will be obviously hinder the future development of that country.

Brain Drain was recognized as an issue in 1960, when most of the intellectuals like scientists and engineers who were the real assets or the future of any country began to emigrate from United Kingdom to the United States. Brain Drain has become a burning issue in the Sri Lankan context. There is growing trend in migration of intellectuals. Brain Drain has become a serious issue by the time of 1977, as the Sri Lanka adopted the open economic policy. Statistics suggest that more than 21,000 professionals and 350,000 skilled labourers have migrated to the other countries during the period of five years from 2010-2014, even after the end of the war in 2009. Over the centuries the magnitude and scope of such skill flows have grown: in the last quarter century this phenomenon has developed into an international crisis.

**Body**

**What drives Brain Drain?**

There are many factors which affect Brain Drain in a country. Especially in developing countries, Brain Drain is severe than that of the developed countries. When professionals decide that their home country does not reward their skill adequately, in terms of pay, carrier development or both they tend to look for other better opportunities. On the other hand Brain Drain process may be trigged due to reasons like political turmoil, famine, poor quality of life or other similar factors as well.

However there are two most common ways of happening Brain Drain. Either the Individuals that study abroad completes their education and do not return home or individuals who study in the home country emigrates for higher wages and better opportunities.

In the Sri Lankan context Brain Drain evolved in many ways. By the time of independence, Sri Lanka has had an adequate number of professionals to





